# කාර්යසාධන වාර්තාව
## சயெலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT
# 2024



කාර්යසාධන වාර්තාව 2024

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

வனப் பாதுகாப்புத் திணைக்களம்

**DEPARTMENT OF FOREST CONSERVATION**

පරිසර අමාත්‍යාංශය
சுற்றாடல் அமைச்சு
**Ministry of Environment**

# කාර්යසාධන වාර්තාව 2024

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වැය ශීර්ෂ අංකය 283

**පරිසර අමාත්‍යාංශය**

# අන්තර්ගතය


අන්තර්ගතය ................................................................................................ iii

වගු ලැයිස්තුව ..................................................................................................v

ඡායාරූප ලැයිස්තුව ........................................................................................vi

**01 පරිච්ඡේදය ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය ..........................................1**

**1.1** හැඳින්වීම ...........................................................................................1

**1.2** ආයතනයේ දැක්ම,මෙහෙවර.....................................................................2

**1.3** ප්‍රධාන කාර්යයන් .................................................................................3

**1.4** සංවිධාන සටහන ...................................................................................5

**1.5** දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ..................................................................7

**02** පරිච්ඡේදය ප්‍රගතිය හා ඉදිරි දැක්ම ...........................................................**12**

**2.1** ලබාගන්නා ලද ප්‍රගතිය ...........................................................................**12**

**2.2 2024** වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන් /අමතර ක්‍රියාකාරකම්.................**43**

**2.3 2024** වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග................**44**

**2.4** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම ..........................................**45**

**03** පරිච්ඡේදය **2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය.............................................................................................. **46**

**3.1** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ...................................................................... 46

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය ...................................................................... 47

**3.3** මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ....................................................................... 48

**3.4** මූල්‍ය ප්‍රකාශ සටහන් ..................................................................................... 49

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය ............................................................. 50

**3.6** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ..................................... 50

**3.7** මු. රෙ. **208** ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.......... 51

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ..................................................... 52

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව ................................................................... 53

**04** පරිච්ඡේදය කාර්යසාධන දර්ශක ...................................................................... **65**

**4.1** කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ) ......................................................................... **65**

**05** පරිච්ඡේදය තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්යසාධනය ........................**68**

**5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ................................68**

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ................................74**

**06 පරිච්ඡේදය මානව සම්පත් පැතිකඩ ................................................................75**

**6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ................................................................75**

**6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් බලපාන ආකාරය ................................75**

**6.3 මානව සම්පත් සංවර්ධනය................................................................75**

**6.4 2024 වසරේ විශ්‍රාම ගැනීම් ................................................................75**

**6.5 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම................................................76**

**6.6 මියගිය නිලධාරින් පිළිබඳ විස්තර ................................................................76**

**6.7 විනය කටයුතු ................................................................76**

**6.8 සේවය අත්හැර යාම් ................................................................77**

**6.9 දේශීය/ විදේශීය පාඨමාලා................................................................77**

**6.10 පුහුණු වැඩසටහන් ................................................................82**

**6.11 ණය ලබාදීම................................................................85**

**6.12 තොරතුරු අයිතිවාසිකම් ඒකකය ................................................................85**

**07 පරිච්ඡේදය අනුකූලතා වාර්තාව ................................................................86**

**7.1 අනුකූලතා වාර්තාව................................................................86**

# වගු ලැයිස්තුව


| | | |
|---|---|---|
| වගුව 2.1 | දෙපාර්තමේන්තු වැඩසටහන - 2024- නඩත්තු | 14 |
| වගුව 2. 2 | පරිසර කළමනාකරණ කටයුතු | 15 |
| වගුව 2.3 | රක්ෂිත හා ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත හා රක්ෂිතභාවයෙන් නිදහස් කිරීමට නියමිත වනාන්තර | 18 |
| වගුව 2.4 | රක්ෂිත හා ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත වනාන්තර | 19 |
| වගුව 2.5 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගොවි වන වගා ස්ථාපනය කිරීම | 20 |
| වගුව 2. 6 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2022/2023 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම | 21 |
| වගුව 2. 7 | දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන් | 22 |
| වගුව 2. 8 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සංවර්ධනය කිරීම | 23 |
| වගුව 2. 9 | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැළ නිෂ්පාදනය කිරීම | 24 |
| වගුව 2. 10 | දීප ව්‍යාප්ත රුක් රෝපණ වැඩසටහන් | 25 |
| වගුව 2. 11 | මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් | 26 |
| වගුව 2. 12 | නාගරික තුරුගොමු ස්ථාපනය | 27 |
| වගුව 2. 13 | වනාන්තර වලින් පිටත රුක් රෝපණය | 28 |
| වගුව 2. 14 | පයිනස් වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම | 29 |
| වගුව 2. 15 | පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 2024 | 30 |
| වගුව 2.16 | සංචාරක පැමිණීම - 2024 | 42 |
| වගුව 2. 17 | සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම | 42 |
| වගුව 2. 18 | වන වගා කළමනාකරණය | 43 |
| වගුව 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 46 |
| වගුව 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 47 |
| වගුව 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 48 |
| වගුව 3.4 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 50 |
| වගුව 3.5 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 50 |
| වගුව 3.6 | මු.රෙ.208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 51 |
| වගුව 3.7 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම | 52 |
| වගුව 4.1 | කාර්යසාධන දර්ශක | 65 |
| වගුව 5.1 | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 68 |
| වගුව 6. 1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 75 |
| වගුව 6. 2 | 2024 වසරේ බඳවාගැනීම් | 75 |
| වගුව 6. 3 | 2024 වසරේ විශ්‍රාම ගැනීම් | 76 |
| වගුව 6. 4 | සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම | 76 |
| වගුව 6. 5 | මියගිය නිලධාරින් පිළිබඳ විස්තර | 76 |
| වගුව 6. 6 | විනය කටයුතු | 77 |
| වගුව 6. 7 | සේවය අත්හැර යාම් | 77 |
| වගුව 6. 8 | දේශීය / විදේශීය පාඨමාලා | 77 |
| වගුව 6. 9 | පුහුණු වැඩසටහන් | 82 |
| වගුව 7. 1 | අනුකූලතා වාර්තාව | 86 |

## ඡායාරූප ලැයිස්තුව


| | | |
|---|---|---|
| රූපය 2.1 | දිඹුලාගල අරලගන්විල බීට්ටුවේ කන්දේගම ANR වගාව | 13 |
| රූපය 2.2 | කඩොලාන සංරක්ෂණය හා නඩත්තුව | 13 |
| රූපය 2 .3 | ගොවි වන වගා ස්ථාපනය | 21 |
| රූපය 2.4 | බීජ පැළ හා පැළ තවාන් නඩත්තුව | 21 |
| රූපය 2.5 | වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම | 23 |
| රූපය 2.6 | ගෙවතු සවර්ධනය කිරීම | 24 |
| රූපය 2.7 | බීජ පැල නිෂ්පාදනය කිරීම | 25 |
| රූපය 2. 8 | දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන් පැවැත්වීම | 26 |
| රූපය 2. 9 | මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම | 27 |
| රූපය 2.10 | නාගරික තුරු ගොමු ස්ථාපනය | 27 |
| රූපය 2.11 | වනාන්තරවලින් පිටත රුක් රෝපණ වැඩසටහන් | 28 |
| රූපය 2.12 | සිංහරාජ රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම | 31 |
| රූපය 2.13 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ පිටදෙනිය පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම | 32 |
| රූපය 2.14 | සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ කාර්යාලය සංවර්ධනය කිරීම | 32 |
| රූපය 2.15 | කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි මංපෙත් නඩත්තු කිරීම | 33 |
| රූපය 2.16 | උඩවත්ත කැලේ වනෝද්‍යානය තුල සංචාරකයන් හට පාපැදියෙන් සංචාරය කිරීම සඳහා මන්තීරුවක් සකස් කිරීම | 33 |
| රූපය 2.17 | හුරුළු පාරිසරික උද්‍යානයෙහි මාර්ග සංවර්ධනය කිරීම | 34 |
| රූපය 2.18 | හුරුළු පාරිසරික උද්‍යානයෙහි ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම | 34 |
| රූපය 2.19 | හුරුළු පාරිසරික උද්‍යානයෙහි බැලුම්ගල අලුත්වැඩියාව | 35 |
| රූපය 2.20 | ඉහලකන්ද වැව අළුත්වැඩියා කිරීම | 36 |
| රූපය 2.21 | පුත්තලම දිසාවේ ගල්විල පාරිසරික උද්‍යානයේ කඳවුරු භූමි ඇති කිරීම | 36 |

# 01 පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය හා සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම කාර්යභාරය සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2024 වර්ෂය තුළ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති පරිදි පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

•සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රශස්ථ වන ආවරණයක් පවත්වා ගැනීම.

•රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා නිෂ්පාදන වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.

•ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.

•රජයේත්, ප්‍රජාවගේත්, පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් තුරු වැස්ම ඉහළ නැංවීම.

•පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.

•ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු ව්‍යාප්ත කිරීම.

•පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

•වන නිෂ්පාදන හා සේවාවන් තිරසාර ලෙස භාවිතය හා කළමනාකරණය කිරීම.

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ 13ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් (i) සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති (ii) වන විද්‍යා සහ වන වගා කළමනාකරණ (iii) භූ විද්‍යා තොරතුරු හා වන සංගණන (iv) පරිසර කළමනාකරණ හා භූ සම්පත් (v) පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු (vi) වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම (vii) සැලසුම් හා ප්‍රගති පාලන (viii) පාරිසරික සංචාරක (ix) ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ (x) ප්‍රවාහන අංශය (xi) මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන (xii) මුදල් අංශය (xiii) අභ්‍යන්තර විගණන යන අංශ ඒ යටතට ගැනේ.

මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මඟින් විස්තර කෙරේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්ක වල පිහිටි දිසා වන කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු කොළඹ, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය සහ කිළිනොච්චිය යන දිස්ත්‍රික්ක වල ස්ථාපනය කර ඇති කලාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මඟින් අධීක්ෂණය කරනු ලැබේ.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී සිදු කරයි. පර්යේෂණ කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථාන වල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන වල අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ සිදු කෙරේ.

## 1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර

**දැක්ම**

රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වැඩී එන ඉල්ලුම සපුරාලීම මෙන් ම මනා පාරිසරික සේවාවන් පවත්වාගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසාර අයුරින් කළමණාකරණය කිරීම.

**මෙහෙවර**

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

• මනා දේශගුණික තත්ත්වයන් මෙන් ම පස, ජල සම්පත්, සතුන් හා වෘක්ෂලතා සංරක්ෂණය හා රටෙහි සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික, විනෝදාත්මක හා සමාජ ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන ආවරණයක් දිවයිනෙහි පවත්වාගෙන යාම.

• වනබිම් සතු භූමි ලක්ෂණ, වන සතුන් හා වෘක්ෂලතා, ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, පාරිසරික හා සමාජීය ලක්ෂණ සැලකීමට ගත් ඒකාබද්ධ භූමි පරිශීලනය මඟින් වන බිම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

• වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය සඳහා මෙන් ම අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමඟින් පාංශු හා ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම.

• අනාගත දැව අවශ්‍යතා අඛණ්ඩව සපුරා ගැනීම උදෙසා වන සම්පත් විද්‍යාත්මක පදනමින් කළමනාකරණය කිරීම සහ ඒවායේ තිරසාර සංවර්ධනය සහතික කිරීම.

• වන සම්පත් තිරසාර සංවර්ධනයට ලක් කිරීම සඳහා අවශ්‍ය වන, වන විද්‍යා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

• වන සම්පත් සංවර්ධනය උදෙසා දායකවන්නා වූ අනෙකුත් ආයතන සමඟ වෘත්තීය මට්ටමින් සම්බන්ධතා පවත්වාගෙන යාම.

• ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම උදෙසා වන සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය ඉලක්ක කොටගත් ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

• වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ අවබෝධය හා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම.

• තත්කාලීනව බලපවත්නා වන සංරක්ෂණ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව වන සම්පත් ආරක්ෂා කිරීම.

• ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම.

• පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් වන සංවර්ධන ක්‍රියාවලීන් ප්‍රවර්ධනයට පියවර ගැනීම.

# 1.4 සංවිධාන සටහන



වන සං.ජ.
අති වන.සං.ජ.(මෙහෙයුම්)
අති වන.සං.ජ.( අධ්‍යාපන)
අති වන.සං.ජ.( පරිපාලන)
වන සං (ව. ආ. නි.ක්‍රි.)
වන සං (පරි.ක.භූ. ස)
වන සං (ව. වි. ව. ව)
වන සං (ස . ව. වි. වා)
වන සං (සැ.භා.ප්‍ර.පා)
වන සං (පා.ස)
වන සං (ජෛ වි ජ සං)
වන සං (භූ වි තො)
වන සං (පර්යේෂණ)
වන සං (අ. ධා. සං)
වන සං (පි.පා)
ප්‍ර.ග
ප්‍ර.අ.වි.
නි.ව.සං.-කලාප (05)
නි.ව.සං. (02 )
නි.ව.සං. (01
ග-II - 01
නි.නි.
ස.ව.සං
ස.ව.සං/දි.ව.නි.(23)
ගණකාධි. III
ස.ව.සං
ස.ව.සං
ස.ව.සං
වි.ව.පා.
පරි. නි
භාෂා පරි.
පරි. නි
පරි. නි
සං.නි
ව.පා.
සං.නි
සං.නි
සං.නි
ක.සේ.නි.
අ.ව.නි.
සැ.ශි.
පුස්තකාලාධි.
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
බී .ව.නි
ව.ව්‍යා.නි.
වන.ක්.ස
ව.ගා.ක./ කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස

**කෙටි යෙදුම**

| | | |
|---|---|---|
| වන.සං.ජ | - | වන සංරක්ෂක ජනරාල් |
| අති.ව.සං.ජ (මෙහෙයුම්) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) |
| අති.ව.සං.ජ (අධ්‍යාපන) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (අධ්‍යාපන,පර්යේෂණ හා පුහුණු) |
| අති.ව.සං.ජ (පරිපාලන) | - | අතිරේක වන සංරක්ෂක ජනරාල් (මානව සම්පත් කළමනාකරණ, පරිපාලන හා ආයතන සංවර්ධන) |
| වන.සං (පරි.ක.භූ.ස) | - | වන සංරක්ෂක (පරිසර කළමණාකරණ හා භූ සම්පත්) |
| වන.සං (සැ.ප්‍ර.පා) | - | වන සංරක්ෂක (සැලසුම් හා ප්‍රගති පාලන) |
| වන.සං (ව.වි.ව.ව.ක) | - | වන සංරක්ෂක (වන විද්‍යා හා වන වගා කළමනාකරණ) |
| වන.සං (ස.ව.වි.ව.ව්‍යා) | - | වන සංරක්ෂක (සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති) |
| වන.සං (ව.ආ.නී. ක්‍රි). | - | වන සංරක්ෂක (වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම) |
| වන.සං (පා.ස) | - | වන සංරක්ෂක (පාරිසරික සංචාරක) |
| වන.සං (ජෛ.වි.ජ.සං) | - | වන සංරක්ෂක (ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ) |
| වන.සං (භූ.වි.තො.වන.සං) | - | වන සංරක්ෂක (භූ විද්‍යා තොරතුරු හා වන සංගණන) |
| වන.සං (පර්යේෂණ ) | - | වන සංරක්ෂක ( පර්යේෂණ ) |
| වන.සං (අ.ධා.සං) | - | වන සංරක්ෂක (අධ්‍යාපන හා ධාරිතා සංවර්ධන) |
| වන.සං - ( පි.පා) | - | වන සංරක්ෂක (පිරිස් හා පාලන) |
| ප්‍ර.ග | - | ප්‍රධාන ගණකාධිකාරී |
| ප්‍ර.අ.වි | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| නී.නි | - | නීති නිළධාරී |
| නි.ව.ස | - | නියෝජ්‍ය වන සංරක්ෂක |
| ගණකාධි. - ii | - | ගණකාධිකාරී |
| ස.ව.සං. | - | සහකාර වන සංරක්ෂක |
| ගණකාධි. - iii | - | ගණකාධිකාරී |
| පරි.නි | - | පරිපාලන නිළධාරී |
| වි.ව.පා | - | විශේෂ වන පාලක |
| භාෂා පරි. | - | භාෂා පරිවර්තක |
| සං.නි | - | සංවර්ධන නිලධාරී |
| ක.සේ.නි | - | කළමනාකරණ සේවා නිලධාරි |
| අ.ව.නි | - | අඩවි වන නිලධාරී |
| පුස්තකාලාධි. | | පුස්තකාලාධිපති |
| සැ.ශි | - | සැලසුම් ශිල්පී |
| බී.ව.නි | - | බීට්ටු වන නිලධාරී |
| ව.ව්‍යා.නි | - | වන ව්‍යාප්ති නිලධාරී |
| ව.ක්.ස | - | වන ක්ෂේත්‍ර සහකාර |
| ව.ගා.ක | - | වගා කම්කරු |
| කා.කා.ස | - | කාර්යාල කාර්ය සහයක |

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ 13 යටතේ පාලනය වේ.

### 1.5.1: සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති අංශය

ජාතික මට්ටමේ වන ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන් ම සියලු ම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩසටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, වන ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා බීජ පැළ නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ ප්‍රජාව සඳහා නියමු මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනා දී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම ද පැවරී තිබේ. ස්වාභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතු වල වගකීම ද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය. තව ද අයවැය යෝජනා මත වන සණත්වය වැඩි කිරීම සඳහා ලබා දුන් විශේෂ මුදල් ප්‍රතිපාදන යටතේ විශේෂ වන වගා ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් රැසක් ද මෙම අංශය යටතේ පාලනය කරනු ලැබේ.

### 1.5.2: පරිසර කළමනාකරණ හා භූ සම්පත් අංශය

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියලු පරිසර පද්ධතීන්හි ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. තව ද වනාන්තර කළමනාකරණ සැලසුම් සකස් කිරීම, භූ සම්පත් සමීක්ෂණය හා තිරසාර භාවිතය සඳහා වූ සැලසුම් සකස් කිරීම ද මෙම අංශය යටතට ගැනේ.

### 1.5.3: වන ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන වගකීම වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන් ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත් ද, සුරැකීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ නීතිමය පසුබිම සැකසීම වේ. එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීම, ප්‍රාදේශීය කාර්ය මණ්ඩල හදිසි වැටලීම් අංශය සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම මෙන් ම ආරක්ෂිත ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රකාශයට පත් කිරීම සහ වන සංරක්ෂණ අඥා පනත සඳහා නියෝග සකස්කිරීම ද මෙම අංශය සතු වගකීම් වේ.

### 1.5.4: භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය

භූ විද්‍යා තොරතුරු හා වන සංගණන අංශය ප්‍රධාන වශයෙන් රටේ වන සම්පත් ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ පවතින වනාන්තර මිනුම් කිරීම සහ සිතියම් සැකසීම, වනාන්තරවල මායිම් සලකුණු කිරීම, ස්වාභාවික සහ ස්ථාපිත වනාන්තරවල සංගණනයන් සිදු කිරීම, වන වගාවන් වල සංගණන දත්ත අඩංගු දත්ත සමුදාය පවත්වාගෙන යාම, වන ආවරණ සිතියම් සැකසීම, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් වලට අවශ්‍ය අංකිත සිතියම් සැකසීම, වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය උපලේඛන සැකසීම හා ඒවා පරීක්ෂා කිරීම වේ. තව ද පැරණි ගුවන් ඡායාරූප, අංකිත දත්ත, භූ සිතියම්, ගුවන් ඡායාරූප ලබාගත් රේඛාවන් දක්වන භූ සිතියම් ආරක්ෂිතව ගබඩා කර තැබීම ද මෙම අංශයේ වගකීමක් වේ.

### 1.5.5: සැලසුම් හා ප්‍රගති පාලන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම මෙන් ම ගොඩනැගිලි ඉදි කිරීම, අධීක්ෂණය සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ දියුණු කිරීම යන ක්‍රියාකාරකම් ද සැලසුම් හා ප්‍රගති පාලන අංශය විසින් සිදු කරනු ලැබේ.

### 1.5.6: පාරිසරික සංචාරක අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් හි ප්‍රමුඛතම අංශයක් වන සංචාරක කර්මාන්තයට ඉහළ දායකත්වයක් ලබාදිය හැකිවන්නා වූ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන්නා වූ ස්වභාවික වනාන්තර ආශ්‍රිතව ඉතා ඉහළ විභවයක් ඇත. තව ද පාරිසරික සංචාරක කර්මාන්තය මඟින් වනාන්තර ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඇති ඉහළ විභවය නිසි පරිදි කළමනාකරණය කර ග්‍රාමීය දිළිඳුකම පිටු දැකීම සඳහා ද පාරිසරික සංචාරක කර්මාන්තය යොදා ගැනීමට හැකියාව තිබේ.

පාරිසරික සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු අධ්‍යාපනික වැඩසටහන් සහ සංචාරකයින් සමඟ ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ද යොදාගැනීමට හැකියාව ඇත. මේ සඳහා සංචාරකයින්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන එම අවශ්‍යතා සැපයීමට දෙස් විදෙස් සංචාරකයින් විශාල ලෙස ආකර්ශණය කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, පරිසර පද්ධති සංරක්ෂණය තහවුරු කර ගනිමින්, ප්‍රජාවගේ සුභ සිද්ධිය සැලසීම සහ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා පාරිසරික සංචාරක ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ වගකීම වේ.

### 1.5.7: වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශය

දැව නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් තිරසාර ලෙස වන වගා කළමනාකරණය කිරීම වන විද්‍යා හා වන වගා කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. වන වගා ස්ථාපනය කිරීම හා කළමනාකරණය, අස්වනු නෙළීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත වන වගා නිදහස් කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙම අංශය දායක වේ. පයිනස් වගා බිම්වලින් පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් රෙසින් නිස්සාරණය කිරීම සහ පුද්ගලික අංශය සමග නැවත වගා කිරීමේ කටයුතුවල නිරත වීම මෙම අංශයේ අනෙකුත් වගකීම් වේ.

### 1.5.8: ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශය

ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ අංශයේ අරමුණ වනුයේ ජෛව විවිධත්වය, පස, ජලය කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත පරපුර වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමය. වන ආවරණය වැඩි කිරීම හා සංරක්ෂණය කිරීම, වන ආවරණය වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීම, ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගනිමින් වන වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කඩොලාන නැවත වගා කිරීම හා පවතින කඩොලාන පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, කැළෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වැව් තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම යනාදී ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් පුළුල් විෂයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී.

### 1.5.9: පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු අංශය

පර්යේෂණ, අධ්‍යාපන සහ පුහුණු අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුළ, පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.මේ යටතේ පර්යේෂණ අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වලින් ද, අධ්‍යාපන අංශය, නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය යන අංශ මඟින් ද පාලනය වේ.

වන විද්‍යා පර්යේෂණ ආයතනය මඟින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩසටහන, පර්යේෂණ මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරණය කිරීමෙහිලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින් සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යා සම්බන්ධ ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් (NVQ 5 සහ 6 මට්ටමේ) ආශ්‍රිත පුහුණු වැඩසටහන් නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් සිදු කරනු ලබයි. තව ද පුද්ගලික අංශයෙන් සහ රජයේ වෙනත් නියෝජිත ආයතනවලින් සිදුකරන ඉල්ලීම්වලට අනුව කෙටි කාලීන පුහුණු වැඩසටහන්

සිදුකරනු ලැබේ. දඹුල්ල ඉනාමළුවේ පිහිටි ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානය පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමණාකරණ ව්‍යාපෘතියේ ආධාර යටතේ අළුතින් ඉදිකර ඇත.

### 1.5.10: ප්‍රවාහන අංශය

මෙම අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, සංචිතයේ තිබෙන වාහන වලට සහ නිලධාරින්ට වෙන් කරන ලද වාහන වලට ඉන්ධන සැපයීම සහ රියදුරන්ගේ අතිකාල, අමතර ප්‍රවාහන ඉන්ධන ඉල්ලීම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම යනාදී කටයුතු සඳහා වගකියනු ලැබේ. මෙයට අමතරව, ප්‍රධාන කාර්යාලයට හා අනෙකුත් ක්ෂේත්‍ර කාර්යාලවලට අයත් වාහන ගර්හිත කිරීම, අළුත්වැඩියා කටයුතු සඳහා සහ ඉන්ධන සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයීම ද ප්‍රධාන කාර්යාලයේ වාහන සේවා කිරිමේ කටයුතු හා රක්ෂණය කිරීමේ කටයුතු ද, සියලුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ හා ක්ෂේත්‍ර කාර්යාලවල වාහන වල සිදු වන අනතුරු සම්බන්ධව කටයුතු කිරීම ද මෙම අංශය මඟින් සිදු වේ

### 1.5.11: මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. එමෙන් ම මහජනයාට උපරිම සේවාවක් සැපයීම උදෙසා පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුළ තම සේවාව මනාව ඉටු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිසා වන කාර්යාල, අඩවි වන කාර්යාල, වන විද්‍යාලය හා පර්යේෂණ මධ්‍යස්ථාන වල සේවයේ නියුතු මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

පිරිස් හා පාලන යන විෂයයන්ට අදාළ කටයුතු මෙම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ විධි විධාන සහ අදාළ නීති, රෙගුලාසි සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුළත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වලට අනුකූලව සියලු බඳවා ගැනීම්, උසස් වීම් හා අනෙකුත් වරප්‍රසාද ලබා දීම් සිදු කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කෙරේ.

### 1.5.12: මුදල් අංශය

දෙපාර්තමේන්තුවට අදාළ මූල්‍යමය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල් අංශය මඟිනි. මෙම අංශය මහා භාණ්ඩාගාරය, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැලසුම් කිරීම, මෙහෙයවීම, පාලනය හා ගිණුම් තැබීම, මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් සහ දෙපාර්තමේන්තු ආදායම් සම්බන්ධ මූල්‍ය පාලනය, මහා භාණ්ඩාගාරයට සහ දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය මූල්‍යමය

තොරතුරු වර්ගීකරණය කර ඉදිරිපත් කිරීම, විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සහ දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින කැළෑ ගිණුම් සම්බන්ධ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

### 1.5.13: අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ VII වන කොටසේ 40 වන වගන්තිය මෙන්ම, මුදල් රෙගුලාසි සංග්‍රහයේ වගන්ති අංක 133,134 හා අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ අනුව ඉටු කරනු ලබන රාජකාරි කටයුතු පිළිබඳ තොරතුරු වන සංරක්ෂණ ජනරාල් වෙත සෘජුවම වාර්තා කරනු ලබයි.

දෙපාර්තමේන්තු කාර්යයන්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව සිදුවේ ද යන්න පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම තුලින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහල නංවා ගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන විධිවල ප්‍රමාණාත්මකභාවය ඇගයීමකට ලක් කොට එහි තත්ත්වයන් පිළිබඳ වන සංරක්ෂක ජනරාල් වෙත වාර්තා කිරීම සිදු කරයි.

## 02 පරිච්ඡේදය ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ලබාගන්නා ලද ප්‍රගතිය

වන සංරක්ෂණය හා සංවර්ධනය මූලික කරගත් කාර්යයන් සමුදායක් 2024 වසර තුළ දියත් කළ අතර ඒවායේ කාර්යසාධනය පහත අංශ ඔස්සේ විස්තර කෙරේ.

### 2.1.1 හානියට පත් වනාන්තර නැවත ප්‍රතිස්ථාපනය කිරීම

#### 2.1.1.1 වන ආවරණය ඉහළ නැංවීම.

විවිධ හේතූන් මත හායනයට පත් ස්වභාවික වනාන්තර වල ගුණාත්මය වැඩිකිරීමේ අරමුණින් ස්වභාවික පුනර්ජනනය වැඩිකිරීම මගින් පසුගිය වසර 05ක් තුළ ප්‍රතිස්ථාපනය ආරම්භ කරන ලද වනාන්තර බිම් හෙක්ටයාර 3698 ක් නඩත්තු කර පවත්වාගෙන යන ලදි.

ANR වැඩසටහන්, වනාන්තර ප්‍රතිස්ථාපන වැඩසටහන්, වැව්තාවුළු සංරක්ෂණය, ආගමික ස්ථානවල පැළ සිටුවීම, ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම කටුපඳුරු සහිත ඉඩම් වනාන්තර බවට පත් කිරීම, අත්හැර දමන ලද ගෙවතු වනාන්තර බවට පත් කිරීම, රණවිරු රුක්රෝපණය යන විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ සිදු කරන ලදී.

**(i) ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලද වනාන්තර නඩත්තු (ANR Maintain)**

ස්වභාවික පුනර්ජනනය වේගවත් කිරීමේ වැඩසටහන් යටතේ අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් දිස්ත්‍රික්කයන්හි හෙක්. 3654.4ක භූමි ප්‍රදේශයක නඩත්තු කටයුතු සිදුකරන ලදී.



*රූපය 2.1: දිඹුලාගල අරලගන්විල බීට්ටුවේ කන්දේගම ANR වගාව*

**(ii) ප්‍රතිස්ථාපිත කඩොලාන වනාන්තර නඩත්තු කිරීම**

පරිහානියට පත්වී ඇති කඩොලාන ප්‍රතිස්ථාපනය යටතේ පසුගිය වසරවල පුත්තලම, මුලතිව්, අම්පාර, මඩකලපුව, කළුතර, ත්‍රිකුණාමලය, ගම්පහ යන දිස්ත්‍රික්ක 07ක ආරම්භ කරන ලද ප්‍රතිස්ථාපන කටයුතු වලින් හෙක්ටයාර 326.6ක නඩත්තු කටයුතු සිදු කරන ලදී.



*රූපය 2.2: කඩොලාන සංරක්ෂණය හා නඩත්තුව*

**(iii) ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම**

ප්‍රතිස්ථාපනය කරන ලද වනාන්තර නඩත්තු කිරීම යටතේ අනුරාධපුරය, රත්නපුරය, ත්‍රිකුණාමලය, කළුතර, මොණරාගල, වවුනියාව, මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක 09ක හෙක්ටයාර 306ක වනාන්තර නඩත්තු කටයුතු සිදුකරන ලදී

**(iv) රණවිරු රුක් රෝපණය හා නඩත්තුව**

රණවිරු රුක් රෝපණ නඩත්තු වැඩසටහන යටතේ මොණරාගල, අම්පාර, ගාල්ල දිස්ත්‍රික්කයන්හි හෙක්ටයාර 47ක භූමි ප්‍රදේශයක රණවිරු රුක් රෝපණ නඩත්තු කටයුතු සිදු කරන ලදී.

**(v) කටු පඳුරු සහිත ඉඩම් වල ස්ථාපිත කල වන වගා නඩත්තු කිරීම**

අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් යන දිවයිනේ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි හෙක්ටයාර 622.3ක නඩත්තු සිදුකරන ලදි

**(vi) වැව් තාවුලු වල වගා කරන ලද වනවගා නඩත්තු**

අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, හම්බන්තොට, මහනුවර, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව,මන්නාරම,කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක 18ක විවිධ ස්ථානවල හෙක්ටයාර 156.6ක නඩත්තු කටයුතු සිදුකරන ලදි.

**(vii) ආගමික ස්ථානවල රුක් සිටුවීම/නඩත්තු කිරීම**

අනුරාධපුර මහමෙව්නා උයන තුළ හෙක්. 04 භූමි ප්‍රදේශයක සිටුවන ලද පැළ නඩත්තු කටයුතු සිදු කරන ලදි.

### 2.1.1.2 කැලෑ ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ක්ෂේත්‍රයේ සියලුම නිලධාරීන්ගේ සහාය ඇතිව දිවයින පුරා කැලෑ ගිනි පාලනය කිරීමේ වැඩසටහන් 253ක් පවත්වන ලදී.ඒවා නම් කැලෑ ගිනි නිවීම, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, පෝස්ටර් සහ බැනර් ප්‍රචාරණ කටයුතු, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් නිවේදන නිකුත් කිරීම, ශ්‍රමදාන පැවැත්වීම වේ. ගිනි නිවීම් සඳහා අවශ්‍ය වන ගිනි පාලන උපකරණ කට්ටල මිලදී ගැනීම් සහ නඩත්තු කිරීම් 70ක් සිදු කර ඇත. තවද, ගිනි ඇතිවීම වැලැක්වීම සඳහා විවිධ වනාන්තර ආශ්‍රිත කි.මී.33.41ක ගිනි පටි කැපීම සිදු කර ඇත.

**2.1.1.3 දෙපාර්තමේන්තු වැඩසටහන - 2024- නඩත්තු**

*වගුව 2.1 : දෙපාර්තමේන්තු වැඩසටහන - 2024- නඩත්තු*

| කාර්යය | ඉලක්ක 2024භෞතික ප්‍රගතිය (හෙක්.) | ඉලක්ක - 2024 මූල්‍ය (රු.)මිලියන | මූල්‍ය ප්‍රගතිය(රු.) මිලියන | භෞතික ප්‍රගතිය( හෙක්) |
|---|---|---|---|---|
| ස්වභාවික වනාන්තර පුනර්ජනනය නඩත්තු (ANR Maintain) | 3698 | 96.42 | 96.42 | 3654.4 |
| ප්‍රතිස්ථාපිත කඩොලාන වනාන්තර නඩත්තු කිරීම | 327 | | | 326.6 |
| ප්‍රතිස්ථාපිත වනාන්තර නඩත්තු කිරීම | 306 | | | 306 |
| රණවිරු රුක් රෝපණ නඩත්තු | 47 | | | 47 |
| කටු පඳුරු සහිත ඉඩම් වල ස්ථාපිත කල වන වගා නඩත්තු කිරීම | 623 | | | 622.32 |
| අත්හරින ලද ගෙවතු වල ස්ථාපිත කරන ලද වනාන්තර නඩත්තු කිරීම | 130 | | | 130 |
| වැව් තාවුලු වල වගා කරන ලද වනවගා නඩත්තු | 183 | | | 156.6 |
| ආක්‍රමණශීලී ශාක ඉවත් කරන ලද වනාන්තර නඩත්තු කිරීම | 180 | | | 180 |
| ආගමික ස්ථාන වල රුක් රෝපණය නඩත්තු ( අනුරාධපුර මහමෙව්නා උයන) | 4 | | | 4 |
| කැලෑ ගිනි පාලනය | | 10 | 9.69 | |

**2.1.1.4 වන ආවරණය ඉහළ නැංවීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම.**

මේ වන විට පහත සඳහන් ව්‍යාපෘති සිදු කෙරෙමින් පවතිනු ලැබේ.

- යක්කල Lions Club සමඟ මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 200ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.
- AmPark Foundation සමඟ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 100 ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.
- AmPark Foundation සමඟ එක්ව මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්.100 ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.
- රුක් රැක ගන්නෝ පරිසර සංවිධානය සමග රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 20ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය
- Sri lanka business and bio diversity සමඟ ගාල්ල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 02 ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.

- Earth lanka youth network සමග එක්ව නුවරඑළිය දිස්ත්‍රික්කයේ හෙක්. 3.29 ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.
- සම්පත් බැංකුව සමඟ රත්නපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 01ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය
- SARP (Ministry of agriculture) සමඟ අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 562.91 ක වනාන්තර ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය.

**2.1.1.5 කඩොලාන වන ආවරණය ඉහළ නැංවීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම.**

- Sri Lankan Airline සමඟ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රදේශයේ හෙක්ටයාර 50ක කඩොලාන වගා ප්‍රතිස්ථාපනය
- Sri Lanka Telecom සමඟ පුත්තලම දිස්ත්‍රික්කයේ පුබුදුගම ප්‍රදේශයේ හෙක්ටයාර 4.2ක කඩොලාන වගා ප්‍රතිස්ථාපනය
- Hayles ආයතනය සමඟ පුත්තලම දිස්ත්‍රික්කයේ පුබුදුගම ප්‍රදේශයේ හෙක්ටයාර 8.9ක වගා ප්‍රතිස්ථාපනය

## 2.1.2 වන කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම, සකස් කිරීම සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය

**2.1.2.1 නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම ,වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම හා වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කරගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම**

මෙහිදී 2024 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලස්මට අනුව දිස්ත්‍රික්ක 23 මූලික කර ගනිමින් නව වන කළමනාකරණ සැලසුම් 50ක් සකස් කිරීමට තිබූ නමුත් නව වන කළමනාකරණ සැලසුම් 197 සකස් කර අවසන් කර ඇත. තවද වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02ක් පවත්වා ඇත. (දකුණු /සබරගමුව කලාපය සහ වයඹ/බස්නාහිර කලාපය සඳහා). 2024 වසරේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් නකල්ස් සංරක්ෂිතය හා සිංහරාජ රක්ෂිතය මූලික කර ගනිමින් කර ගනිමින් පවත්වා ඇත.

*වගුව 2. 2: පරිසර කළමනාකරණ කටයුතු*

| අනු අංකය | වැඩසටහන | 2024.12.31 දින වන විට අවසන් කල යුතු ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය | 2024.12.31 දින වන විට ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ලබා ඇති භෞතික ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| 2.1.2.1 | ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම | ස්වභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 50 ක් සකස් කිරීම. | ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 197ක් සකස් කර ඇත. | 100% + |
| 2.1.2.2 | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම | වැඩමුළු 05 ක් පැවැත්වීම ( උතුරු මැද/ නැගෙනහිර කලාපය , උතුරු කලාපය , දකුණ /සබරගමුව කලාපය | වැඩමුළු 02ක් පැවත්වා ඇත. (දකුණ /සබරගමුව කලාපය , වයඹ /බස්නාහිර කලාපය) | 40% |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා වැඩමුළු පැවැත්වීම | , වයඹ /බස්නාහිර කලාපය , මධ්‍යම/ ඌව කලාපය). | එමඟින් වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම වේගවත් කර ඇත. | |
| 2.1.2.3 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහන් පැවැත්වීම | නකල්ස් සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම | නකල්ස් සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහන් පවත්වා ඇත. | 60% |
| | | සිංහරාජ සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම | සිංහරාජ සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩසටහන් පවත්වා ඇත. | 40% |

## 2.1.3 ස්ථිර වනාන්තර පද්ධතියක් ස්ථාපිත කිරීම මඟින් දැනට ඇති වනාන්තර ආරක්ෂා කිරීම

### 2.1.3.1 වනාන්තර මායිම් සලකුණු කිරීම හා සිතියම් සකස් කිරීම

i. වනාන්තර මායිම් සලකුණු කිරීම හා ඒවා ප්‍රකාශයට පත් කිරීම සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයකින් සිදු කිරීම අත්‍යාවශ්‍ය වූ බව පෙනී ගිය හෙයින් විශේෂයෙන් යුද්ධය නිසා පීඩා විඳි උතුර, නැගෙනහිර, උතුරු මැද පළාත් වල සියළු දිස්ත්‍රික්ක හා මොණරාගල දිස්ත්‍රිකය ඇතුළු දිස්ත්‍රික්ක 11 ක එම කටයුතු පසුගිය වර්ෂයේ ආරම්භ කරන ලදී.

ii. මේ සඳහා අමාත්‍ය මණ්ඩල සටහන් දෙකකින් හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් මාර්ගෝපදේශ ලැබු අතර මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණි.

iii. ඒ අනුව වනාන්තර ලෙස කළමණාකරණය කළ හැකි භූමි හඳුනා ගන්නා ලද අතර තවද ප්‍රකාශිත රක්ෂිත භූමි තුළ පිහිටි වනාන්තර ලෙස තවදුරටත් කළමණාකරණය කළ හැකි භූමි මෙන්ම වනාන්තර නොමැති සංවර්ධනය වූ ජනාවාස සහිත භූමිද හඳුනාගන්නා ලදී.

iv. උතුරු හා නැගෙනහිර පළාත් වල රක්ෂිත භූමි ප්‍රකාශයට පත් කරන ලද්දේ වසර 100 කට පමණ පෙර සිට වන අතර එම දීර්ඝ කාලය තුළ විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම රක්ෂිත වනාන්තර තුළ පිහිටි ජනාවාස හා කෘෂි භූමි ඇති බවට නිරීක්ෂණය විය.

v. තවද යුද්ධය අවසානයේදී බිම් මැනුමක් සිදු නොකර මායිම් ප්‍රකාශයට පත් කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ජනතාව විසින් පරිහරණය කරන ලද භූමි ද රක්ෂිත වනාන්තර වලට ඇතුලත් විය.

vi. මෙම ගැටළු නිරාකරණය කරමින්, උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශ සහ පත්‍රිකා වල මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් රක්ෂිත තුළ පිහිටි වනාන්තර ලෙස කළමණාකරණය කළ

හැකි භූමි හා වන සතුන්ගේ වාසස්ථාන සඳහා වැදගත් වන භූමි ප්‍රදේශ හඳුනාගෙන එම භූමි ප්‍රදේශ වල මායිම් හඳුනාගෙන සිතියම් ගත කරන ලදී.

vii. වනාන්තර ලෙස කළමණාකරනය කළ යුතු එහෙත් රක්ෂිත වනාන්තර ලෙස මෙතෙක් ප්‍රකාශයට පත් නොකළ වනාන්තර ද හඳුනාගැනීම මේ යටතේ සිදු කරන ලදී.

viii. මෙයට අමතරව රක්ෂිත වනාන්තර තුළ පිහිටි තවදුරටත් වනාන්තර ලෙස කළමණාකරණය කළ නොහැකි ජනාවාස හා කෘෂිකාර්මික භූමි ද සිතියම් ගත කරන ලදී.

ix. මේ සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා පවත්වන ලද අතර මෙම අවස්ථාවන් වලදී විවිධ සංවර්ධන යෝජනා සඳහා ඉල්ලීම් ඉදිරිපත් විය.

x. එසේ සිතියම් ගත කරන ලද ඉඩම් දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශය සහිතව ජනාධිපති ලේකම් ප්‍රමුඛ අන්තර් අමාත්‍යාංශ කමිටුවට යොමු කෙරිණ.

xi. වවුනියාව, කිලිනොච්චිය, මුලතිව්, යාපනය, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්ක සඳහා අන්තර් අමාත්‍යාංශ කමිටු පවත්වන ලදී. එහිදී අන්තර් අමාත්‍යාංශ කමිටුව විසින් පහත එකඟතාවයන් 05 ක් ලබා දෙන ලදී.

අ. රක්ෂිත තුල පිහිටි ස්ථිර වශයෙන් පදිංචි වී සිටින/කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නා ලද දැනට වනාන්තර ලෙස නොපවතින, වනජීවී සංචරනයන්ට බාධා නොවන ඉඩම්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට බැහැර කිරීම.

ආ. 1985 වනාන්තර සහිතව තිබූ මේ වන විටත් වනාන්තර සහිත භූමි තුල සංවර්ධන කටයුතු සඳහා නිදහස් කරන ලෙස ඉදිරිපත් වී ඇති ඉල්ලීම් සලකා නොබැලීම.

ඇ. 1985 වනාන්තර රහිත මේ වන විට වනාන්තර සහිත භූමි තුල සංවර්ධන කටයුතු සඳහා නිදහස් කරන ලෙස ඉදිරිපත් වී ඇති ඉල්ලීම් සලකා බැලීමට විධිමත් සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කර ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව කටයුතු කිරීම.

ඈ. දැනට අධිකරණ කටයුතු සඳහා යොමු කළ ඉඩම්, අධිකරණ කටයුතු නිමවීමෙන් පසුව සලකා බැලීම

ඉ. වනාන්තර ලෙස කලමනාකරණය කිරීමට හඳුනාගන්නා ලද ඉඩම් අදාල වන සංරක්ෂණ අඥා පනත් අනුව ආරක්ෂා කිරීම

xii. ඒ අනුව එම අන්තර් අමාත්‍යාංශ කමිටුවේ තීරණ අනුව ද රක්ෂිත හා ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත හා රක්ෂිතභාවයෙන් නිදහස් කිරීමට නියමිත වනාන්තර ප්‍රමාණය පහත පරිදි වේ.

*වගුව 2.3: රක්ෂිත හා ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත හා රක්ෂිතභාවයෙන් නිදහස් කිරීමට නියමිත වනාන්තර*

| අනු අංකය | දිස්ත්‍රික්කය | රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත වනාන්තර ප්‍රමාණය (හෙක්.) | ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත වනාන්තර ප්‍රමාණය (හෙක්.) | රක්ෂිතභාවයෙන් නිදහස් කිරීමට නියමිත වනාන්තර ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|
| 1 | වවුනියාව | 36,677.46 | 586.39 | 12,964.17 |
| 2 | කිලිනොච්චිය | 5,411.26 | 1,364.22 | 22,537.00 |
| 3 | මුලතිව් | 12,257.91 | - | 17,449.00 |
| 4 | යාපනය | 366.88 | 439.57 | - |
| 5 | මන්නාරම | 11,667.17 | 1,218.45 | 2,896.00 |
| 6 | ත්‍රිකුණාමලය | 29,701.55 | 1,376.75 | 24,250.00 |
| 7 | මඩකලපුව | 16,144.60 | 311.44 | 11,138.00 |
| 8 | අම්පාර | 24,842.44 | 209.83 | 12,130.00 |
| **මුළු එකතුව (හෙක්.)** | | **137,069.27** | **5,506.65** | **103,364.17** |

xiii. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම් ප්‍රමුඛ අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර ක්ෂේත්‍ර මැනුම් ඒකාබද්ධව කටයුතු ආරම්භ කරන ලදී.

xiv. මෙම මායිම් හඳුනාගැනීමේ කටයුතු සම්පූර්ණයෙන් වවුනියා දිස්ත්‍රික්කයේ අවසන් කරන ලදී.

*වගුව 2.4: රක්ෂිත හා ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීමට නියමිත වනාන්තර*

| විස්තරය | හඳුනාගන්නා ප්‍රමාණය (හෙක්.) | ගැසට් කරන ලද ප්‍රමාණය (හෙක්.) | ගැසට් කිරීම සඳහා මුද්‍රණාලය වෙත භාර දෙන ලද ප්‍රමාණය (හෙක්.) | ගැසට් කිරීමට නියමිත ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|
| රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කිරීම (හෙක්.) | 36,677.46 | 1,159.00 | 8,045.30 | 28,078.00 |
| ගම්බද වනාන්තර ලෙස ගැසට් කිරීම (හෙක්.) | 586.39 | - | - | 586.39 |
| රක්ෂිතභාවයෙන් නිදහස් කිරීම (හෙක්.) | 12,964.17 | 554.30 | 79.00 | 11,726.00 |

xv. අනෙකුත් දිස්ත්‍රික්ක වලද මෙම කටයුතු ආරම්භ කළද පැවති මැතිවරණ කටයුතු හේතුවෙන් මෙම කටයුතු අත්හිටවන ලදී.

xvi. එසේම මේ සම්බන්ධව තවත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2024.06.24 දින ඉදිරිපත් විය. එමඟින් රත්නපුර, පුත්තලම හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා මෙම වැඩසටහනට එක් කිරීමට එමඟින් එකඟතාවය ලබා දෙන ලදි.

xvii. ඒ අනුව රත්නපුර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල මූලික කටයුතු ආරම්භ කරන ලදී.

xviii. වවුනියාව හැර ඉතිරි දිස්ත්‍රික්කවල සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර අන්තර් අමාත්‍යාංශ කමිටුවේ තීන්දුව අනුව එම දිස්ත්‍රික්කවලද 2025 වර්ෂයේදී මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.

xix. මෙම දිස්ත්‍රික්කවලට අමතරව මොණරාගල, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවලද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් පැවැත්වීමට හා මීට අමතරව පුත්තලම, හම්බන්තොට, රත්නපුර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල අලුතින් මෙම කටයුතු 2025 වර්ෂයේ දී ආරම්භ කිරීමට මූලික කටයුතු සකස් කරමින් පවතී.

#### 2.1.3.2 ජාතික වන සංගණනය නියදි දත්ත ලබා ගැනීම (NFI)

2024 වර්ෂයේදී ජාතික වන සංගණන දත්ත රැස් කිරීම යටතේ නියදි 777 ක දත්ත රැස් කිරීම සිදු කරන ලදි. 2019 වර්ෂයේදී පළමු චක්‍රය යටතේ දත්ත ලබා ගත් ස්ථාන වලම 2024 වර්ෂයේදී දෙවන චක්‍රය යටතේ දත්ත ලබා ගැනීම සිදු කරන ලදී.

## 2.1.4 වන ව්‍යාප්තිය හා දැනුවත් කිරීම්

### 2.1.4.1 ගොවි වන වගා ස්ථාපනය කිරීම

2024 වර්ෂයේ ගොවි වන වගා හෙක්ටයාර් 107.4 ස්ථාපනය සිදු කරන ලද අතර, ඒ සඳහා ගොවීන් 177ක් සහභාගී කරගනු ලැබිය.

*වගුව 2.5: දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගොවි වන වගා ස්ථාපනය කිරීම*

| දිසාව | ස්ථාපිත ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) | නිපදවූ පැළ සංඛ්‍යාව | සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| බදුල්ල | 15 | 15000 | 30 |
| මොණරාගල | 59 | 37620 | 80 |
| මහනුවර | 6.6 | 4600 | 33 |
| වව්නියාව | 7 | 7000 | 9 |
| රත්නපුර | 20 | 20000 | 25 |
| **එකතුව** | **107.6** | **84220** | **177** |



*රූපය 2.3: ගොවි වන වගා ස්ථාපනය*

### 2.1.4.2. ස්ථාපිත ගොවි වන වගා පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු

2022 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 411.25 ක්ද, 2023 වර්ෂය තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 408.55ක්ද විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී.

*වගුව 2.6 : දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2022/2023 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම*

| දිසාව | 2022 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) | 2023 ගොවි වනවගා ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| බදුල්ල | 52.00 | 36.75 |
| මොණරාගල | 50.00 | 28.00 |
| මාතලේ | 55.40 | 46.27 |
| මහනුවර | - | 4.00 |
| පොළොන්නරුව | 10.00 | 60.00 |
| අනුරාධපුර | 132.35 | 130.60 |
| මඩකලපුව | 8.00 | 5.00 |
| අම්පාර | 35.00 | - |
| මුලතිව් | - | 40.00 |
| වව්නියාව | 10.00 | 26.00 |
| රත්නපුර | 3.60 | 14.65 |
| කුරුණෑගල | 39.90 | - |
| පුත්තලම | 15.00 | 17.28 |
| **එකතුව** | **411.25** | **408.55** |

### 2.1.4.3 බීජ පැළ හා පැළ තවාන් නඩත්තුව

මේ යටතේ දිවයින පුරා ඇති දිසා වන කායාීල වලට අනුබද්ධ පැල තවාන්වල ඉතිරිව ඇති පැල 900,000 ක් හා තවාන් 5ක් නඩත්තු කිරීම සඳහා කටයුතු කර ඇත.



*රූපය 2.4 : බීජ පැළ හා පැළ තවාන් නඩත්තුව*

### 2.1.4.4 වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම

පරිසර සංරක්ෂණය ,ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය ,ජෛව විවිධත්වය සංරක්ෂණයෙහිලා පාසල් සිසුන් හා ප්‍රජාව නැඹුරු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගිනි කළමනාකරණ වැඩසටහන්, ශ්‍රමදාන, ක්ෂේත්‍ර චාරිකා, පරිසර කඳවුරු, හා වෙනත් විශේෂ වැඩසටහන් 944 ක් ක්‍රියාත්මක කරන ලදි

*වගුව 2.7: දීප ව්‍යාප්ත වන ව්‍යාප්ති වැඩසටහන්*

| වැඩසටහන් වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 624 |
| වැඩමුළු | 129 |
| ගිනි කළමනාකරණ වැඩසටහන් | 63 |
| ශ්‍රමදාන | 10 |
| ප්‍රදර්ශන | 14 |
| තරඟ | 27 |
| ක්ෂේත්‍ර චාරිකා | 16 |
| වෙනත් විශේෂ වැඩසටහන් | 61 |
| **එකතුව** | **944** |




*රූපය 2.5 : වන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම*

### 2.1.4.5 ගෙවතු සංවර්ධන  වැඩසටහන් පැවැත්වීම

ගෙවතු 11,360 ක් සඳහා සුදුසු පැළ සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදී.

*වගුව 2.8: දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ගෙවතු සවර්ධනය කිරීම*

| දිසාව | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද ගෙවතු |
|---|---|
| බදුල්ල | 200 |
| මොණරාගල | 200 |
| නුවරඑළිය | 200 |
| මාතලේ | 200 |
| මහනුවර | 200 |
| පොළොන්නරුව | 280 |
| අනුරාධපුර | 280 |
| මඩකලපුව | 280 |

| | |
|---|---|
| අම්පාර | 280 |
| ත්‍රිකුණාමලය | 280 |
| කිලිනොච්චිය | 250 |
| මන්නාරම | 250 |
| මුලතිව් | 250 |
| වව්නියාව | 250 |
| මාතර | 340 |
| රත්නපුර | 6000 |
| කෑගල්ල | 340 |
| හම්බන්තොට | 340 |
| ගාල්ල | 340 |
| කුරුණෑගල | 150 |
| කළුතර | 150 |
| පුත්තලම | 150 |
| ගම්පහ | 150 |
| **එකතුව** | **11360** |






*රූපය 2.6: ගෙවතු සවර්ධනය කිරීම*

### 2.1.4.6 බීජ පැළ නිෂ්පාදනය කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන තවාන් පැළ 405,500ක සංඛ්‍යාවක් 2024 වසර තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල නිපදවන ලදී. නිපදවන ලද සම්පූර්ණ තවාන් පැළ සංඛ්‍යාවෙන් පැළ 82,336 ක් අලෙවි කරන ලද අතර 149,625 ක් විවිධ රුක් රෝපණ වැඩසටහන් සඳහා හා රාජ්‍ය සහ වෙනත් විවිධ ආයතන වෙත නොමිලයේ ලබාදෙන ලදි. තවත් කොටසක් ජාතික රුක් රෝපණ වැඩසටහන් හා ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා යොදා ගන්නා ලදී.

*වගුව 2.9: දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ බීජ පැල නිෂ්පාදනය කිරීම*

| දිසාව | දෙපාර්තමේන්තු බීජ පැළ | |
|---|---|---|
| | **9*6** | **8*12** |
| බදුල්ල | 15,000 | 1,500 |
| මොණරාගල | 15,000 | 2,000 |
| නුවරඑළිය | 8,000 | 1,000 |
| මාතලේ | 17,000 | 2,000 |
| මහනුවර | 12,000 | 1,500 |
| පොළොන්නරුව | 25,000 | 2,000 |

| | | |
|---|---|---|
| අනුරාධපුර | 25,000 | 2,000 |
| මඩකලපුව | 15,000 | 1,000 |
| අම්පාර | 15,000 | 2,000 |
| ත්‍රිකුණාමලය | 15,000 | 1,500 |
| කිලිනොච්චිය | 21,000 | 2,500 |
| මන්නාරම | 15,000 | 1,000 |
| මුලතිව් | 15,000 | 1,000 |
| වව්නියාව | 13,000 | 2,000 |
| මාතර | 10,000 | 1,000 |
| රත්නපුර | 40,000 | 2,000 |
| කෑගල්ල | 15,000 | 2,000 |
| හම්බන්තොට | 17,000 | 2,000 |
| ගාල්ල | 8,000 | 1,000 |
| කුරුණෑගල | 22,000 | 2,000 |
| පුත්තලම | 15,000 | 2,000 |
| ගම්පහ | 15,000 | 2,500 |
| **එකතුව** | **368,000** | **37,500** |



*රූපය 2.7: බීජ පැල නිෂ්පාදනය කිරීම*

#### 2.1.4.7 පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම

පාසල් හා ප්‍රජා සහභාගිත්වයෙන්, මාර්ග දෙපස, ජලාධාර අවට හා ගං ඉවුරුවල, පාසැල් හා රාජ්‍ය ආයතන භූමිවල, ආගමික සිද්ධස්ථාන භූමිවල මෙන්ම වෙනත් ස්ථානවල රුක්රෝපණ වැඩසටහන් 628 ක් ක්‍රියාත්මක කරන ලදි

*වගුව 2.10: දීප ව්‍යාප්ත රුක්රෝපණ වැඩසටහන්*

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| මාර්ග දෙපස රුක් රෝපණය | 50 |
| ජලාධාර අවට හා ගං ඉවුරුවල රුක් රෝපණය | 49 |
| පාසැල්වල රුක් රෝපණය | 187 |
| රජයේ ආයතන භූමිවල රුක් රෝපණය | 155 |
| ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණය | 91 |

| | |
|---|---|
| නාගරික භූමිවල රුක් රෝපණය | 8 |
| වෙනත් ස්ථානවල රුක්රෝපණ | 88 |
| **එකතුව** | **628** |






*රූපය 2.8 : දීප ව්‍යාප්ත රුක්රෝපණ*

### 2.1.4.8 මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන්

මොණරාගල , ත්‍රිකුණාමලය , මන්නාරම , වව්නියාව , මාතර , රත්නපුර , කුරුණෑගල, හම්බන්තොට, ගම්පහ යන දිසාවන්හී මාර්ග දෙපස රුක් රෝපණ කිලෝමීටර් 20ක් සිදු කර ඇත

*වගුව 2.11: මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන්*

| දිසාව | මුළු ඉලක්කය(km) |
|---|---|
| මොණරාගල | 1 |
| ත්‍රිකුණාමලය | 1 |
| මන්නාරම | 0.5 |
| වව්නියාව | 0.5 |
| මාතර | 1 |
| රත්නපුර | 10 |
| හම්බන්තොට | 2 |
| කුරුණෑගල | 3.5 |
| ගම්පහ | 0.5 |
| **එකතුව** | **20** |





*රූපය 2.9 : මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම*

### 2.1.4.9 නාගරික තුරුගොමු 20ක් ස්ථාපනය

මාතලේ, අම්පාර, හා රත්නපුර යන දිසාවන්හී නාගරික තුරුගොමු 4ක් ස්ථාපනයට කටයුතු කරන ලදී.

*වගුව 2.12: නාගරික තුරුගොමු ස්ථාපනය*

| දිසාව | තුරුගොමු ගනන |
|---|---|
| මාතලේ | 1 |
| අම්පාර | 1 |
| රත්නපුර | 2 |
| **එකතුව** | **4** |





*රූපය 2.10 : නාගරික තුරුගොමු ස්ථාපනය*

### 2.1.4.10 වනාන්තර වලින් පිටත රුක් රෝපණ වැඩසටහන

මේ යටතේ දිවයින පුරා ප්‍රධාන වැඩසටහන් 23ට සමගාමීව වැඩසටහන් 465ක් පවත්වා ඇත

*වගුව 2.13: වනාන්තරවලින් පිටත රුක් රෝපණ වැඩසටහන*

| දිසාව | වැඩසටහන් ගණන |
|---|---|
| බදුල්ල | 05 |
| මොණරාගල | 01 |
| නුවරඑළිය | 01 |
| මාතලේ | 18 |
| මහනුවර | 07 |
| පොළොන්නරුව | 24 |
| අනුරාධපුර | 12 |
| මඩකලපුව | 01 |
| අම්පාර | 38 |
| ත්‍රිකුණාමලය | 01 |
| කිලිනොච්චිය | 01 |
| මන්නාරම | 56 |
| මුලතිව් | 02 |
| වව්නියාව | 16 |
| මාතර | 36 |
| රත්නපුර | 39 |
| කෑගල්ල | 50 |
| හම්බන්තොට | 45 |
| ගාල්ල | 15 |
| කුරුණෑගල | 52 |
| කළුතර | 16 |
| පුත්තලම | 25 |
| ගම්පහ | 04 |
| **එකතුව** | **465** |



*රූපය 2.11: වනාන්තරවලින් පිටත රුක් රෝපණ වැඩසටහන්*

### 2.1.5 වානිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)

### 2.1.5.1වානිජ වන වගා ස්ථාපිත කිරීම (RCT)

පරිනත වූ වානිජ වනවගා හෙක්ටයාර් 179.44 ක් හෙළීම් සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාර දී ඇත.(නුවරඑළිය, බදුල්ල, අනුරාධපුර, පොලොන්නරුව,කුරුණෑගල, මුලතිව්, කළුතර, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල ) ඉන් වන වගා හෙක්ටයාර් 177.24 ක් 2024 වර්ෂයේ දී රාජ්‍ය දැව සංස්ථාව විසින් හෙළීම් අවසන් කර නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර, එහි වනවගා ප්‍රතිස්ථාපනය සිදුකර අවසන් කර ඇත.

### 2.1.5.2 පැළ තවාන් ස්ථාපනය හා නඩත්තුව

නැවත වනවගා කිරීමේ වැඩසටහන සඳහා හෙක්ටයාර් 179.44 කට අවශ්‍ය බීජ පැල නිෂ්පාදනය කර, මාස 10 කට ආසන්න කාලයක් තවාන් තුල නඩත්තු කිරීම සිදු කරනු ලබයි. මෙහි දී තවාන් තුල තේක්ක, ඉයුකැලිප්ටස්, කායා, හල්මිල්ල හා දේශීය විශේෂ නිෂ්පාදනය කර ඇත.

### 2.1.5.3 නොමේරූ වනවගා නඩත්තු

රාජ්‍ය දැව සංස්ථාව විසින් පූර්ණ හෙළීම් සිදුකර නැවත වනවගා සිදු කරන ලද පසුගිය වසර 03 ක නොමේරූ වනවගා හෙක්ටයාර් 4608 කින් හෙක්ටයාර් 4407 ක් නඩත්තු කටයුතු 2024 වර්ෂයේ දී සිදුකර ඇත. එහි දී වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැලැක්වීම හා පාළු පැල සිටුවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේ දී ස්ථාපිත වනවගා නඩත්තුව වාර 03 ක් ද, 2022 වර්ෂයේ දී ස්ථාපිත වනවගා නඩත්තුව වාර 02 ක් ද හා 2021 වර්ෂයේ ස්ථාපිත වනවගා වාර් 01 ක් ද නඩත්තු කරන ලදී.

### 2.1.5.8 පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම

පුද්ගලික අංශයේ සමාගම් 06 ක පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම සහ සාලිය බණ්ඩාර මහතා, චානක සමරවීර මහතා, JCT කෙමිකල්ස් (පුද්. ) සමාගම ශ්‍රී ලංකා රෙසින් (පුද්) සමාගම, විලව් මෝබයිල් ආයතනය, සිය වානිජ මට්ටමේ රෙසින් නිස්සාරණ කටයුතු වලට අදාල ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වනවගා වල රෙසින් නිස්සාරණ කටයුතු 2024 වර්ෂය පුරා සිදු කරන ලදී. හෙක්.302.3 ක ඉඩම් ප්‍රමාණයක් රෙසින් නිස්සාරණ කටයුතු සඳහා පුද්ගලික අංශය වෙත බදු දී ඇති අතර, 2024 ඉන් ලද ආදායම රුපියල් මිලියන 6.16

*වගුව 2. 14: පයිනස් වනවගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම*

| සංවිධානයේ නම | බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.) | බදු ආදායම (රුපියල්) |
|---|---|---|
| 1. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම | 19 | 187,112.00 |
| 2. සාලිය බණ්ඩාර | 14.6 | 1,927,200.00 |
| 3.චානක සමරවීර | 60 | 660,000.00 |
| 4. ජේ.සී.ටී. කෙමිකල්ස් | 73 | 341,275.00 |
| 5.සිලොන් රෙසින් (පුද්) සමාගම | 49.2 | 1,024,063.50 |
| 6. විලව් මෝබයිල් | 86.5 | 2,024,931.70 |
| **එකතුව** | **302.3** | **6,164,582.20** |

### 2.1.5.9 2024 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය.

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2024 වර්ෂය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රුපියල් මිලියන 572.9 කි. මෙයට පූර්ණ හෙලීම් මගින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රුපියල් මිලියන 548 ක් ද, පරිනත වනවගා කළමනාකරණය මගින් ලබා ගන්නා දැව වල වටිනාකම වන රුපියල් මිලියන 15.9 ක් ද, වන අපරාධ වලින් අත්පත් කරගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැවවල වටිනාකම වන රුපියල් මිලියන 8.9 ද ඇතුලත් වේ.

### 2.1.5.10 පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩ සටහන 2024

පුද්ගලික අංශය සතු සම්පත් වනවගා සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණින් පුද්ගලික අංශයේ නැවත වනවගා කිරීමේ වැඩ සටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩ සටහනේ අදියර දෙකක් වසර 2000 දී 2002 දී දියත් කරන ලදී. 2019 වර්ෂයේ දී පුද්ගලික අංශය සමඟ ඇති කර ගත් ගිවිසුම් අනුව හෙක්. 327.12 ක වනවගා කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

*වගුව 2. 15 : පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන 2024*

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | (හෙක්.) |
| කුරුණෑගල | ගල්ගමුව | 1108 | තේක්ක | ✓ | | 11.142 |
| | ගල්ගමුව | 1091 | තේක්ක | ✓ | | 6.244 |
| අනුරාධපුරය | අනුරාධපුරය | 2002/01 | තේක්ක | | ✓ | 40.00 |
| | අනුරාධපුරය | 2002/09 | තේක්ක | | ✓ | 83.00 |
| | අනුරාධපුරය | 2002/12 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 17 | තේක්ක | ✓ | | 20.234 |
| පොළොන්නරුව | හබරණ | 2002/26 | මිශ්‍ර විශේෂ | | ✓ | 47.00 |
| මාතලේ | නාඋල | 1180 | තේක්ක | ✓ | | 9.50 |
| | නාඋල | 1228 | තේක්ක | ✓ | | 4.00 |
| | නාඋල | 2002/15 | තේක්ක | | ✓ | 3.00 |
| | නාඋල | 2002/20 | තේක්ක / කාංසා | | ✓ | 90.00 |
| | නාඋල | 2002/18 | තේක්ක | | ✓ | 5.00 |
| | නාඋල | 2002/16 | තේක්ක | | ✓ | 4.00 |
| එකතුව | | | | 05 | 08 | 327.12 |

### 2.1.6 පරිසර සංචාරක කටයුතු

2.1.6.1 පාරිසරික සංචාරක ගමනාන්ත 16 ක්, සංචාරක බංගලා 04 ක් සහ ප්‍රවේශ පත්‍ර කවුළු 09ක් සංචාරක කටයුතු සඳහා පහසුකම් වැඩි දියුණු කර නඩත්තු කටයුතු සිදු කරන ලදී.

- සංචාරක ගමනාන්ත 16
    1. සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය, කුඩව සහ පිටදෙණිය
    2. කන්නෙලිය

3. උඩවත්ත කැලේ
4. නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානය, මහනුවර සහ මාතලේ
5. බඩගමුව
6. කුරුළු කැලේ
7. මාකන්දාව
8. බඹරගල
9. ඇල්ලගල
10. ඕහිය
11. මන්දාරම් නුවර
12. කන්දෙ ඇල
13. හුරුළු පාරිසරික උද්‍යානය
14. ගල්ඔය පාරිසරික උද්‍යානය
15. ගල්විල පාරිසරික උද්‍යානය
16. අඩාහැලෙන ඇල්ල

- සංචාරක බංගලා 04

1. කොස්ගුලන වන නිවහන
2. හිරිකටු ඔය කඳවුරු භූමිය
3. දෝතළුගල කඳවුරු භූමිය
4. මානිගල වන නිවහන

- ප්‍රවේශ පත්‍ර කවුළු 09

1. තන්ගප්පුව ප්‍රවේශ පත්‍ර කවුළුව
2. දවටගල ප්‍රවේශ පත්‍ර කවුළුව
3. රත්න ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව
4. රිවර්ස්ටන් ප්‍රවේශ පත්‍ර කවුළුව
5. සේර ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව
6. මන්දාරම් නුවර ප්‍රවේශ පත්‍ර කවුළුව
7. හුරුළු ප්‍රවේශ පත්‍ර කවුළුව
8. පොල්ලේබැද්ද ප්‍රවේශ පත්‍ර කවුළුව
9. අකුල්බොඩ ප්‍රවේශ පත්‍ර කවුළුව



*රූපය 2.12 : සිංහරාජ රක්ෂිතයේ ස්වභාවික මංපෙත් නඩත්තු කිරීම.*



*රූපය 2.13 : සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ පිටදෙනිය පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම*



*රූපය 2.14: සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ කාර්යාලය සංවර්ධනය කිරීම*

කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි අවහිර වී තිබුණු කාණු පද්ධතිය පිළිසකර කර, වැසි ජලය බැහැර වන ලෙස සකසා මාර්ගයට ආරක්ෂාව සැලසීම සහ මංපෙත් නඩත්තු කිරීම.



*රූපය 2.15:කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි මංපෙත් නඩත්තු කිරීම.*

උඩවත්ත කැලේ වනෝද්‍යානය තුල සංචාරකයන් හට පාපැදියෙන් සංචාරය කිරීම සඳහා මන්තීරුවක් සකස් කර එය සංචාරකයන් සඳහා විවෘත කිරීම.




*රූපය 2.16: උඩවත්ත කැලේ වනෝද්‍යානය තුල සංචාරකයන් හට පාපැදියෙන් සංචාරය කිරීම සඳහා මන්තීරුවක් සකස් කිරීම*

පොළොන්නරුව හුරුළු පාරිසරික උද්‍යානයෙහි කි.මී.20ක වාහන යටවීමේ අවධානමක ඇති මඩ සහිත ස්ථාන සංවර්ධනය කිරීම.



*රූපය 2.17: හුරුළු පාරිසරික උද්‍යානයෙහි මාර්ග සංවර්ධනය කිරීම*

පොළොන්නරුව හුරුළු පාරිසරික උද්‍යානයෙහි ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම 18km (එක් පැත්තක් මීටර 10 බැගින් මීටර 20ක් දක්වා)



*රූපය 2.18:හුරුළු පාරිසරික උද්‍යානයෙහි ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම*

පොළොන්නරුව හුරුළු පාරිසරික උද්‍යානයෙහි බැලුම්ගල අලුත්වැඩියා කිරීම



*රූපය 2.19:හුරුළු පාරිසරික උද්‍යානයෙහි බැලුම්ගල අලුත්වැඩියාව*

ගල්ඔය පාරිසරික උද්‍යානය, ඉහලකන්ද වැව අළුත්වැඩියා කිරීම





රූපය 2.20:ඉහලකන්ද වැව අළුත්වැඩියා කිරීම

පුත්තලම දිසාවේ ගල්විල පාරිසරික උදායනයේ කඳවුරු භූමි ඇති කිරීම. එකවර සංචාරකයන් 08 දෙනෙකුට නවාතැන්ගත හැකි පරිදි මෙම කඳවුරු භූමිය ස්ථාපිත කර ඇත. මෙම වසරේ මුල් කාර්තුවේ සිට මෙය සංචාරකයන් සඳහා විවෘතව පවතී.






රූපය 2.21: පුත්තලම දිසාවේ ගල්විල පාරිසරික උදායනයේ කඳවුරු භූමි ඇති කිරීම

### 2.1.7 පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු අංශය

2024 ක්‍රියාකාරි සැලැස්මට අනුව අත්‍යාවශ්‍ය පුහුණු වලට ප්‍රතිපාදන හා අත්තිකාරම් ලබාදී පුහුණු සිදුකර ඇත. ඒ අනුව ධාරිතා සංවර්ධන යටතේ පහත සඳහන් පරිදි පුහුණු පාඨමාලා පවත්වා ඇත. රාජ්‍ය භාෂා දෙමළ පුහුණු පාඨමාලා පැවැත්වීම යටතේ  පැය 150 පාඨමාලාවක් හා පැය 100 පුහුණු පාඨමාලා 2ක් නිලධාරීන් 343 ක්  වෙනුවෙන් සිදුකර ඇත. 2023 වර්ෂයේදී  දෙවන අදියර යටතේ බඳවාගත් නවක වන ක්ෂේත්‍ර සහකාර නිලධාරින් සඳහා වූ පුහුණු පාඨමාලාව යටතේ නිලධාරින් 36 දෙනෙකු පුහුණු කර ඇත.

ශාක විශේෂ වල කළමනාකරණ සැලසුම් සකස් කිරීමට අදාලව පුහුණු වැඩසටහන් 5ක් සඳහා නිලධාරින් 224 ක් සහභාගී කරවීම. මීට අමතරව වෙනත් වැඩසටහන් යටතේ 2024 වර්ෂයේ නවක සහකාර වන සංරක්ෂක නිලධාරීන් 17 ක් සඳහා පුහුණු පාඨමාලාවක් පැවැත්වීම ඇතුළුව හා තවත් අත්‍යාවශ්‍ය පාඨමාලා 5ක නිලධාරීන් 75 ක් සඳහා පුහුණු ලබා දී ඇත.

මෙම දේශීය පාඨමාලාවන්ට අමතරව නිලධාරින්ගේ දැනුම හා තාක්ෂණික කුසලතාවයන් වර්ධනය උදෙසා දෙපාර්තමේන්තු නිලධාරීන් 9ක් විදෙස් පුහුණු 4ක් සඳහා හා නිලධාරීන් 21 ක් විදෙස් සම්මන්ත්‍රණ 8ක් සඳහා යොමුකිරීම සිදුකරන ලදී.

අප අංශය මඟින් සිදුකරන ලද අනිකුත් ප්‍රධාන කාර්යයන් යටතේ, Sri Lanka Forester විද්‍යාත්මක සඟරාවේ 42 කලාපය ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. භාෂා පරිවර්තන කටයුතු යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරි සඳහා අවශ්‍ය ලිපි ලේඛන/වාර්තා වලට අදාලව භාෂා පරිවර්තන කටයුතු 92 ක් පමණ අවසන් කර ඇත. තවද ජාතික වන පර්යේෂණ කමිටුව අදාලව කමිටු රැස්වීම් 3ක් පවත්වා එමඟින් පර්යේෂණ යෝජනා 52 ක් සමාලෝචනය කර පර්යේෂණ 51 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

### 2.1.8 වන විද්‍යා පර්යේෂණ ආයතනය

2024 වර්ෂයේදී නව පර්යේෂණ අත්හදා බැලීම් සහ තවාන් පර්යේෂණ ස්ථාපනය කිරීම, දැනට ස්ථාපනය කර තිබෙන පර්යේෂණ නඩත්තු කිරීම, ක්ෂුද්‍ර ප්‍රචාරණ (Tissue culture) කටයුතු අඛණ්ඩව සිදු කිරීම සහ බීජ ප්‍රභව සංවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

මෙයට අමතරව අවශ්‍ය පරිදි ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සහ දත්ත රැස් කිරීමේ කටයුතුද සිදුකරන ලදී. ක්ෂේත්‍ර පර්යේෂණ සහ ඒ ඇසුරින් ලබාගන්නා ලද නිරීක්ෂණ පදනම් කරගනිමින් පර්යේෂණ ලිපි 02 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

හෙක්ටයාර 52.6 ක භූමි ප්‍රමාණයක් විවිධ නඩත්තු කටයුතු සිදු කරන ලදී. (ඇතැම් අත්හදා බැලීම් සහ ක්ෂේත්‍ර මෙහෙයුම් ඒකකට වඩා වැඩි සංඛ්‍යාවක් පැවති අතර එක් වරකට වාර ගණනක් නඩත්තු කරන ලදී.)

කෙසේ වුවද , ඇතැම් අත්හදා බැලීම් අසාර්ථක වීම හේතුවෙන් (නියඟ, ගින්නෙන් සිදුවූ හානි සහ වන සතුන්ගෙන් සිදුවන හානි හේතුකොටගෙන ) සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් (අයවැය මගින් වියදම් සීමා කිරීම /භාණ්ඩ සහ සේවා වල මිල ගණන් ඉහළ යාම හේතු කොට ගෙන ) සැලසුම් කල ඇතැම් ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි විය.

1. පර්යේෂණ නඩත්තු කිරීම

   I. කුරුණෑගල පර්යේෂණ මධ්‍යස්ථානය

      2024 වර්ෂය තුලදී පර්යේෂණ 12ක (හෙක්.52.6ක්) නඩත්තු කටයුතු සිදුකරන ලදී. යෝජිත නඩත්තු කිරීම්වල ට අමතරව පොහොර යෙදීම (හෙක්.10) සහ පැළ සිටුවීම (හෙක් 4.2) යන ක්‍රියාකාරම්ද ඇතැම් පර්යේෂණ ආශ්‍රිතව සිදුකරන ලදී.

1.2 පටක රෝපණ පර්යේෂණ (Tissue culture )

- ❖ තේක්ක - (*Tectona grandis*)
- ❖ වල්ලපට්ට - *(Gyrinops walla)*
- ❖ රොස්වුඩ් - (*Dalbergia latifolia*)
- ❖ සුදු හඳුන් - (*Santalum album*)
- ❖ යකිනාරං - (*Atalanta ceylanica*)
- ❖ වෙනිවැල් - (*Coscinum fenestratum)*
- ❖ දසනායකගේ මිහිරිය - (*Polyspora dassanayakei)*
- ❖ වැනිලා - *(Vanila mooni* )

ඉහත දක්වා ඇති ශාක විශේෂ වලට අදාලව වර්ධක මාධ්‍ය සැකසීම,පටක රෝපණය, උපරෝපණය, ගුණනය හා ශාක දැඩි කිරීම පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීමේ කටයුතු කරමින් පවතී.

1.3 වර්ධක ප්‍රචාරණ කටයුතු

- ❖ ක්ලෝන් බීජ උද්‍යාන ඇති කිරීම සඳහා, තෝරාගත් ප්‍රමුඛ ශාක වලින් ලබා ගන්නා ලද තේක්ක රිකිලි 272ක් තේක්ක බීජ පැළ වලට බද්ධ කිරීම
- ❖ රත්හඳුන් රිකිලි 45ක් ගම්මාලු බීජ පැළ 40 කට හා වල්ගම්මාලු බීජ පැළ 05 කට බද්ධ කිරීම
- ❖ විවිධ වර්ධක මාධ්‍ය තුල වර්ධක ප්‍රචාරනය මගින් ලබා ගන්නා ලද වැනිලා ශාක වල වර්ධනය පරික්ෂා කිරීම( *Vanilla planifolia and Vanilla mooni*)
- ❖ මිහිරිය ශාකයේ (*Polyspora dassanayakei)* වර්ධක ප්‍රචාරණය මගින් පැළ වීම පරික්ෂා කිරීමට ලංකාවේ ප්‍රදේශ දෙකක තවාන් තුල පර්යේෂණ සිදු කිරීම (කුඹල්පොළ තවාන සහ නුවරඑළිය රම්බොඩ තවාන)
- ❖ දැව ශාක විශේෂ 08 ක ඉන්ධන දැව භාවිතය සඳහා සුදුසු විභවය පරික්ෂා කිරීම (තෙතමන ප්‍රතිශතය, ඝනත්වය හා දැව අළු අන්තර්ගතය)

| | | |
|---|---|---|
| කායා | - | *Khaya senegalensis* |
| මදටිය | - | *Adenanthera pavonina* |
| කහට | - | *Carey arborea* |
| රොස්වුඩ් | - | *Dalbergia sissoo* |
| කරඳ | - | *Pongamia pinnata* |
| ඇකේසියා මැන්ජියම් | - | *Acacia auriculiformis* |
| කහකෝන | - | *Senna spectabilis* |
| ඉන්දියන් රොස්වුඩ් | - | *Dalbergia latifolia* |

2. නව පර්යේෂණ අත්හදා බැලීම් සහ පැළතවාන් ආශ්‍රිතව සිදුකරන පර්යේෂණ

I. ක්ෂේත්‍ර පර්යේෂණ

I. අධික ලෙස ඛාදනයට ලක් වූ කඳු මුදුන් යථාවත් කිරීමට යොදාගන්නා ලද ක්‍රමවේදයන් විශ්ලේෂණය කිරීම. මේ යටතේ Assisted Natural Regeneration (ANR)) ස්ථාපනය කර ඇති විවිධ පාරිසරික ලක්ෂණ සහිත ස්ථානයන්හි සිටුවා ඇති විශාල බීජ පැළ වල වර්ධන සීඝ්‍රතාවය පිළිබඳව දත්ත රැස් කරන ලදි.

II. දැවමය ශාකවල කළමනාකරණය පිළිබඳ අධ්‍යනය (Timber resource management studies)

මේ යටතේ තේක්ක *(Tectona grandis)* ශාකයේ අවසන් හෙළීම් අවස්ථාවේදී ඇති දැව පරිමාව පිළිබඳ දත්ත රැස් කරන ලදි. මෙම දත්ත රැස් කිරීම ,ඉදිරි කාලයේදී සිදු කිරීමට නියමිත පරිමා වගුවල සංසන්දනාත්මක අධ්‍යනයක් සඳහා යොදාගැනීමට නියමිතය.

III. දේශීය විශේෂ වල සාපේක්ෂ වර්ධනය පිළිබඳ අධ්‍යයනය

මේ යටතේ වියළි කලාපීය දේශගුණයක් පවතින වවුනියාව පම්පෙමඩු ප්‍රදේශයේ සහ වියළි අතරමැදි දේශගුණයක් පවතින කුරුණෑගල ඉරුදෙණියාය යන ප්‍රදේශ වල හෙක්ටයාර 0.5 බැගින් දේශීය විශේෂ යොදාගනිමින් පර්යේෂණයක් සිදු කරන ලදි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම එක් එක් දේශගුණික කලාපයට වඩාත් සුදුසු දේශීය විශේෂ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරිමයි.

IV. විතැන් සංරක්ෂණය (Ex-situ conservation) මගින් දුර්ලභ ශාක විශේෂ සංරක්ෂණය

දුර්ලභ ශාක විශේෂවල පාරිසරික සහ ආර්ථික ප්‍රයෝජන අධ්‍යයනය අරමුණු කරගත් මෙම පර්යේෂණයේදී දොරණ,කොතලහිඹුටු, නැදුන් සහ කලුමැදිරිය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

V. ජීව ශක්තිය යොදා ගැනිම පිළිබඳ පර්යේෂණ

තෙල් කැකුණ *(Aleurites moluccanus* (L) wild *(Enphobiaceae)* ශාකයේ බීජ මගින් නිස්සාරණය කරනු ලබන තෙල් ශක්ති ප්‍රභවයක් ලෙස යොදා ගැනීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙහිදී අතරමැදි හා තෙත් කලාපයේ විවිධ ප්‍රදේශ වලින් බීජ රැස් කිරිම, බීජ පැළ නිපදවීම හා රසායනික විශ්ලේෂණය සඳහා කාර්මික තාක්ෂණික ආයතනය (ITI)වෙත බීජ යොමු කිරීම සිදු කරන ලදී.

## 2.1 නව පර්යේෂණ ප්‍රවේශයන්

ව්‍යාධිවේදී විද්‍යාගාරය සහ පාංශු විද්‍යාගාරයන් ස්ථාපනය සිදු කරන ලද අතර මේ යටතේ ජාතික වන සංගනණ ව්‍යාපෘතිය (NFI) යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් රැස් කරන ලද පස් හා රොඩු සාම්පල විශ්ලේෂණය සිදු කරන ලදි. පස් සාම්පල 1797 ක් හා රොඩු සාම්පල 12ක් විශ්ලේෂණය කරන ලදි.

ව්‍යාධිවේදී විද්‍යාගාරය තුලදි ඉයුකැලිප්ටස් ශාක වල පත්‍ර වලට හා ලපටි බීජ පැල වලට වැළදෙන දිලීර රෝග පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදි.

## 3. බීජ ප්‍රභව නඩත්තු කිරීම

හොරකැලේ ප්‍රදේශයේ පිහිටුවා ඇති හෙක්.13ක් වන බීජ උද්‍යානයේ ශාක වල බීජ සෑදීම දුර්වල තත්වයක පවතින බැවින් පර්යේෂණාත්මක අධ්‍යනයක් ලෙස මෙම ශාක කපා දමා එම මුල් මගින්

පැන නගින රිකිලි නඩත්තු කර බීජ ලබා ගැනීම සඳහා යොදාගැනීමට සැළසුම් කරන ලදි. මේ යටතේ ගස් 111 ක් (හෙක්.0.2ක්) සලකුණු කරන ලද අතර පාලිත ක්‍රම යටතේ ගිනි තැබීම (control burning) අධ්‍යනය කිරීම සඳහා මෙම භූමිය යොදාගන්නා ලද අතර වැඩි පරතරයක් ඇති වන වගාවන් වල ගිණි තැබීම මගින් නඩත්තු කිරීමේ හැකියාවද අධ්‍යයනය කරන ලදී. බරිගොඩ බීජ උද්‍යානයේ (හෙක් 16)නඩත්තු කිරීම සිදු කරන ලදි.

3.1 බීජ ප්‍රරෝහනය පිළිබඳ අධ්‍යයනයන්

- ❖ දොරණ (*Dipterocarpus glandulosus*) ,
- ❖ බෙරලිය *(Doona cordifolia*)
- ❖ අරළු ,(*Terminalia chebula*),
- ❖ කජු *(Anacardium occidentale),*
- ❖ කොතල හිඹුටු (*Salacia reticulata*)
- ❖ යකිනාරං (*Atalantia ceylanica*),
- ❖ කොළොං (*Adina cordifolia),*
- ❖ නෙල්ලි (*Phyllanthus emblica*),
- ❖ මාදං (*Syzygium cumini*),
- ❖ කොහොඹ (*Azadirachta indica*),
- ❖ කරඳ (*Pongamia pinnata)),*
- ❖ රොස්වුඩ් (*Dalbergia latifolia),*
- ❖ මිල්ල (*Bauhinia racemose*),
- ❖ කස (*Casuarina spp)*
- ❖ *පානක්කා* *(Pleurostylia Opposita),*
- ❖ දිවුල්*1* *(Limonia acidissima),*
- ❖ හැළඹ *(Mitragyna parvifolia)*
- ❖ කැකුණ *(Aleurites moluccana)*

4. බීජ රැස් කිරීම - කෘමි ආසාදනයක් හේතුවෙන් බීජ රැස් කිරීම සිදුකර නැත.

**5. පර්යේෂණ වාර්තා සැකසීම**

1. Article of Growth dynamic of *Gyrinops walla* grown in moist monsoon forests in Sri Lanka: case study in Barigoda Natural Forest
2. Draft report on coppice management of teak as an alternative to seedling planting in forest plantations.

**2.1.9 පර්යේෂණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම**

කුඹල්පොළ සහ බදුල්ල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන දෙක නඩත්තු කරන ලදී සනීපාරක්ෂක කටයුතු, ආරක්ෂණ කටයුතු, උපකරණ මිලදී ගැනීම මෙන්ම වෙනත් අවශ්‍ය කරන අළුත්වැඩියා කටයුතු සහ නඩත්තු

කටයුතු අවශ්‍යතාවය අනුව සිදුකරන ලදී. අමතරව විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් සිසුන් ඉලක්ක කර ගෙන පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

### 2.1.10 ශ්‍රී ලංකා ලංකා වන විද්‍යායතනය

වන විද්‍යායතනයේ NVQ 5 2024 ඩිප්ලෝමා පාඨමාලාවේ සියළුම දේශණ හා ප්‍රායෝගික පුහුණු සියල්ල අවසන් කර පළමු හා දෙවන අධ්‍යන වාර විභාග 2 ක් පවත්වා ඇත . ලිඛිත විභාග ප්‍රතිඵල නිකුත් නොකිරීම නිසා වාචික පර්යේෂණය සිදුකර නැත. විභාග ප්‍රශ්ණ පත්‍ර සකසා විභාග සැලැසුම් කිරීම හේතුවෙන් සැලසුම් කරන ලද පුනරීක්ෂණ කටයුතු කිරීම සිදුකර නොහැකිවී ඇත. ඒ අනුව 2024 වසරේ ඩිප්ලෝමා පාඨමාලාවේ බීට්ටු වන නිලධාරි /වන ව්‍යාප්ති නිලධාරි /වැඩබිම් නිලධාරීන් 50 දෙනා පළමුවන හා දෙවන අධ්‍යයන සැසිවලට අදාළ සිද්ධාන්ත හා ප්‍රායෝගික කටයුතු සාර්ථකව නිම කර ඇත.

**ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ පැවති වෙනත් වැඩසටහන්**

- CIGAS පුහුණු වැඩසටහන පැවැත්වීම

  සහභාගි වූ නිලධාරී සංඛ්‍යාව - 200
- වන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන

  සහභාගි වූ නිලධාරී සංඛ්‍යාව - 135
- පටපිළිකන්ද ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ පැවති වන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන

  සහභාගි වූ නිලධාරී සංඛ්‍යාව - 30
- ඌව මධ්‍යම කලාපයේ කනිෂ්ඨ කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන

  සහභාගි වූ නිලධාරී සංඛ්‍යාව - 15

### 2.1.11 සම්පත් කළමනාකරණය

2024 වසරේ දී, කාර්යාල, නිල නිවාස, පර්යේෂණ මධ්‍යස්ථාන, සංචාරක බංගලා හා තවාන් ගොඩනැගිලි 31ක් ක්ෂේත්‍ර නිලධාරින් සඳහා වැඩිදියුණු කර ඇත. එමෙන් ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන වාහන යන්ත්‍රෝපකරණ හා උපකරණ අවශ්‍යතාවය අනුව නඩත්තු කර ඇති අතර, දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, උපකරණ හා යන්ත්‍ර අවශ්‍යතාවය අනුව මිලදී ගෙන ඇත.

## 2.1.12. සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම - 2024

*වගුව 2.16: සංචාරක පැමිණීම - 2024*

| අනු අංකය | ජාතික උද්‍යානය/වනාන්තරය/ ගමනාන්තය | සංචාරකයන් පැමිණීම | | |
|---|---|---|---|---|
| | | දේශීය | විදේශීය | එකතුව |
| 1 | මාකන්දාව | 2,085 | 896 | 2,981 |
| 2 | කුරුළු කැලේ ( කෑගල්ල) | 1,705 | - | 1,705 |
| 3 | නුවරගල ( අම්පාර) | 1,315 | - | 1,315 |
| 4 | එක්ගල් ඔය ( අම්පාර) | 480 | - | 480 |
| 5 | කොට්ටව ( ගාල්ල) | 982 | 233 | 1,215 |
| 6 | කන්නෙලිය ( ගාල්ල) | 40,762 | 2,781 | 43,543 |
| 7 | අඩාහැලෙන ඇල්ල ( ගාල්ල) | 3,952 | 1,637 | 5,589 |
| 8 | හුරුළු පාරිසරික උද්‍යානය | 68,561 | 176,266 | 244,827 |
| 9 | ගල් ඔය පාරිසරික උද්‍යානය | 171 | 404 | 575 |
| 10 | සිංහරාජ ( මාතර) | 31,652 | 13,563 | 45,215 |
| 11 | සිංහරාජය ( රත්නපුර) | 17,213 | 7,653 | 24,866 |
| 12 | නකල්ස් ( මහනුවර) | 9,766 | 3,133 | 12,899 |
| 13 | නකල්ස් ( මාතලේ) | 232,115 | 3,257 | 235,372 |
| 14 | උඩවත්ත කැලේ ( මහනුවර) | 20,577 | 9,036 | 29,613 |
| 15 | රත්න ඇල්ල ( මහනුවර) | 3,647 | 961 | 4,608 |
| 16 | යහන් ගල ( මහනුවර) | - | - | - |
| 17 | ගැරඩි ඇල්ල ( මහනුවර) | - | - | - |
| 18 | පිදුරුතලාගල ( නුවරඑළිය) | 11718 | 159 | 11877 |
| 19 | මන්දාරම් නුවර කොළපතන ඇල්ල | 23,168 | 8 | 23,176 |
| 20 | බඩගමුව පාරිසරික මධ්‍යස්ථානය | 5,791 | 16 | 5,807 |
| 21 | ගල්විල පාරිසරික උද්‍යානය | 135 | 33 | 168 |
| 22 | දොළුකන්ද සංරක්ෂිත වනාන්තරය | 190 | 7 | 197 |
| 23 | බදුල්ල ( ඇල්ල ගල) | 11,441 | 19,876 | 31,317 |
| 24 | කන්දේඇළ | 1,856 | 2 | 1,858 |
| | එකතුව | **489,282** | **239,921** | **729,203** |

## 2.1.12.1 සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම

*වගුව 2.17: සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ආදායම*

| අදායම් විස්තරය | | අදායම (රුපියල්) |
|---|---|---|
| වනාන්තර වලට ඇතුළු වීමෙන් ලද අදායම | දේශීය | 62,506,738.17 |
| | විදේශීය | 333,561,129.15 |
| සංචාරක බංගලා වෙන් කිරීම් වලින් ලද අදායම | | 15,301,063.93 |
| වෙනත් ආදායම් | සෆාරි ජීප් රථ වලින් ලද අදායම | 43,155,148.33 |
| | රූපගත කිරීම් වලින් ලද අදායම | 1,107,235.00 |
| | වනාන්තර නැරඹීමෙන් ලද අදායම | 507,465.00 |
| මුළු ආදායම | | **456,138,779.58** |

## 2.2 2024 වසරේ ක්‍රියාත්මක විශේෂ වැඩසටහන් /අමතර ක්‍රියාකාරකම්

- වනාන්තර ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම් හා ජනතාව සමඟ වන ගැටුම් අවම කිරීම සඳහා උතුර, උතුරුමැද හා නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්කයන්හි සියළුම අදාල පාර්ශව සමඟ ඒකාබද්ධව වනාන්තර මායිම් හඳුනාගැනීම, සිතියම්ගත කිරීම හා සලකුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී

- සංචාරක සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද රුපියල් 131,793,198.26 ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින සංචාරක බංගලා 08 ක් (ඩීන්ස්ටන් සංචාරක බංගලාව, ඇල්ලගල සංචාරක බංගලාව, ඔහිය සංචාරක බංගලාව, උඩවත්තකැලේ සංචාරක බංගලාව, ගල්විල සංචාරක බංගලාව, මාතලේ රිවස්ටන් සංචාරක බංගලාව, යාපනය සංචාරක බංගලාව හා පිටදෙණිය නිවහන) නවීකරණය කරමින් සංචාරකරකයන්ට වඩාත් ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීමට කටයුතු කිරීමට හැකි වීම.

- පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් මඟින් 2023 වසරට වඩා වැඩි අදායමක් 2024 වසරේ ඉපයීමට හැකි වීම. එය 2023 වසරට 117%ක වැඩි වැඩි වීමකි. (2023 වසරේ පාරිසරික අංශය ලැබූ අදායම රු.මිලියන 207,959,792.77 ක් (අංශයට අයත් සංචාරක බංගලා ආදායමද සමඟ) වන අතර එය 2024 වසරේ රු.මිලියන 452,260,167.01 කි)

- කිලිනොච්චි දිසාවේ කැෂුරිනා වනවගාව හෙක්ටයාර් 10 නඩත්තු කිරීම

- පුත්තලම දිසාවේ රණවිරු වනවගාව හෙක්ටයාර් 32 ක් නඩත්තු කිරීම.

- මීට අමතරව රාජ්‍ය දැව සංස්ථාවේ හෙලීම් ප්‍රමාදය මත පූර්ණ හෙලීම් ඉලක්කය අඩු වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් වන වගාවල අස්වැන්න ඉහල නැංවීමේ අරමුණින් අමතර ක්‍රියාකාරකම් වශයෙන් පහත වනවගා කළමනාකරණය කටයුතු සිදුකර ඇත.

*වගුව 2.18: වන වගා කළමනාකරණය*

| දිසාව | ක්‍රියාකාරකම | භූමි ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| බදුල්ල | පූර්ණ වානිජ තුනී කිරීම් | 40.10 |
| මොණරාගල | | |
| නුවරඑළිය | වානිජ තුනී කිරීම් | 142.38 |
| මොණරාගල | වනවගා පවිත්‍ර කිරීම | 502 |
| කුරුණෑගල | | |

| | | |
|---|---|---|
| කුරුණෑගල | 2025 වසරේ දී පූර්ණ හෙළිම් කිරීමට නියමිත වනවගා වල ගස් සලකුණු කිරීම | 273.70 |
| අනුරාධපුර | | |
| පොලොන්නරුව | | |
| රත්නපුර | | |
| නුවරඑළිය | | |
| මාතලේ | | |
| බදුල්ල | | |
| කුරුණෑගල | අමතර වන වගා නඩත්තුව | 797.57 |
| පුත්තලම | | |
| මුලතිව් | | |
| ත්‍රිකුණාමලය | | |
| බදුල්ල | | |
| මහනුවර | | |
| මාතලේ | | |
| මොනරාගල | | |
| කෑගල්ල | | |
| මාතර | | |
| හම්බන්තොට | | |
| නුවරඑළිය | | |
| අනුරාධපුර | | |

- මොණරාගල දිසාවේ  කැබිලිත්ත හෙක්ටයාර් 40 ක් නඩත්තු කරන ලදී

## 2.3. 2024 වසරේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදුවූ අභියෝග

**1.  වන ආරක්ෂණය හා වන අපරාධ අනාවරණය සඳහා ඇති අසීරුතා**

මේ සඳහා 2024 වර්ෂයේ ඩ්‍රෝන 06ක් මිලදී ගැනීමට කටයුතු කර ඒවා මඟින් වන අපරාධ අනාවරණය හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

**2. අවශ්‍යතාවයට සරිලන නිලධාරීන් ප්‍රමාණවත් නොවීම**

ක්ෂේත්‍ර නිලධාරින් ප්‍රමාණවත් නොවීම නිසා වන ආරක්ෂණ කටයුතු හා කළමනාකරණ කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේදී අසීරුතා/කාර්යක්ෂමතාව අවම වීම.

**3.වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ ඇති අසීරුතා**

වාර්ෂිකව ලබාදෙනු ලබන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ක්ෂේත්‍රය තුළ කලමනාකරණ සැලසුම් සකස් කිරීමේදී මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. වන කළමනාකරණ සැලසුම් සකස් කිරීමේදී

වනාන්තර අවට සිටින ප්‍රජාව මගින් වනාන්තරයට සිදුවන බලපෑම පිළිබඳ විශේෂ අවධානයක් යොමුකල යුතුය. ඒ සඳහා සහභාගිත්ව ගැමි විමසුම වැනි දත්ත එකතු කිරීමේ ක්‍රමවේද යොදා ගැනීම තුළින් එහි ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකිය. මෙහිදී මෙම දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය නියමාකාරයෙන් සිදුකිරීමට විශාල මුදලක් අවශ්‍ය වේ. එහෙත් සීමාකාරී ප්‍රතිපාදන තුල පාරිසරික සංචාරක, වන වගා ආදිය සඳහා ප්‍රමුඛතාව ලබා දීමේදී, පවතින දත්ත යොදා ගනිමින් වන කලමනාකරණ සැලසුම් සකස් කිරීම සිදුවේ.

**4.වන ආවරණය වැඩි කිරිම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම.**

ශ්‍රී ලංකාවේ වන ආවරණය වැඩි කිරීමේ කාර්යයේදී, ඒ සඳහා පෞද්ගලික අංශයේ හා විදේශයන්ගේ දායයකත්වය ලබා ගැනීම.

## 2.4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනාගත දැක්ම

1. දැනට හඳුනාගෙන ඇති පාරිසරික සංචාරක ගමනාන්ත වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම තුලින් සංචාරක කටයුතු වලින් රජයට ලැබෙන අදායම් ඉහල නැංවීම.
2. පාරිසරික සංචාරක කටයුතු සඳහා ලැබෙන සීමිත ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් දැනට හඳුනාගෙන ඇති සංචාරක විභව ස්ථානවල නව පාරිසරික සංචාරක ස්ථාන සංචාරකයන්ට විවෘත කිරීමට කටයුතු කිරීම.
3. වන ආරක්ෂණ කලාප කළමනාකරණය තුලින් ස්වභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 50ක් සකස් කිරීම, සකස් කරලන ලද සැලසුම් 100ක් නැවත යාවත්කාලීන කිරීම
4. වඳවී යාමේ තර්ජනයට මුහුණපා ඇති ශාක 05ක් සංරක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
5. ඉදිරි වසර තුල සමස්ත දිවයිනේ සියළු අඩවි ආවරණය වන පරිදි ඩ්‍රෝන මිලදී ගෙන ලබාදීම හා එම තාක්ෂණය උපයෝගී කර ගනිමින් වන අපරාධ අනාවරණයට වන නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සපයා දීම.

# 03 පරිච්ඡේදය

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(2024 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙන් උපුටා ගන්නා ලදී.)

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

වගුව 3.1: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2,024 රු. | 2023 රු. | |
|---|---|---|---|---|---|
| **1,730,000,000** | ආදායම් ලැබීම් | | **1,085,716,097** | 1,861,087,997 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| 130,000,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 112,137,869 | 121,693,246 | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| 1,600,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 973,578,228 | 1,739,394,752 | |
| **1,730,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,085,716,097** | 1,861,087,998 | |
| **70,000,000** | ආදායම් නොවන ලැබීම් | | **3,638,012,306** | 2,575,316,622 | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,676,806,700 | 1,550,930,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 878,142,666 | 942,775,949 | ඒසීඒ-4 |
| 70,000,000 | අත්තිකාරම් ගිණුම් | | 83,062,940 | 81,610,673 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **70,000,000** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,638,012,306** | 2,575,316,622 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **4,723,728,404** | 4,436,404,620 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **827,006,380** | 17,170,888 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 3,896,722,023 | 4,419,233,732 | |
| | අඩු කළා : වියදම් | | | | |
| **1,962,000,000** | පුනරාවර්තන වියදම් | | **2,064,889,196** | 1,767,611,822 | ඒසීඒ-2(ii) |
| 1,672,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,771,452,184 | 1,497,396,155 | |
| 277,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 284,660,318 | 262,233,459 | |
| 13,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 7,612,408 | 7,982,208 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 1,164,285 | - | |
| **1,962,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,064,889,196** | 1,767,611,823 | |
| **703,000,000** | **මූලධන වියදම්** | | | | ඒසීඒ-2(ii) |
| 36,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 60,571,356 | 31,792,853 | |
| 649,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 643,416,713 | 841,458,772 | |
| | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 10,000,000 | හැකියා වර්ධනය | 14 | 9,684,662 | 9,977,355 | |
| 8,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 2,879,233 | 6,895,633 | |
| **703,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **716,551,964** | 890,124,613 | |
| | තැන්පතු ගෙවීම් | | 849,975,478 | 1,064,108,073 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 83,370,722 | 78,058,755 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 933,346,200 | 1,142,166,828 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,714,787,360 | 3,799,903,264 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | 181,934,664 | 619,330,468 | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 152,557,368 | 620,528,257 | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 29,377,296 | (1,197,789) | ඒසීඒ-3 |
| | | | 181,934,664 | 619,330,468 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

*වගුව 3.2: මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය*

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 10,303,181,000 | 4,714,970,273 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 211,279,219 | 210,989,437 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 29,377,296 | (1,197,789) |
| **මුළු වත්කම්** | | **10,543,837,516** | **4,924,761,921** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (527,570,140) | (499,692,734) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 10,303,181,000 | 4,714,970,273 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 738,849,359 | 710,682,171 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 29,377,296 | (1,197,789) |
| **මුළු වගකීම්** | | **10,543,837,516** | **4,924,761,921** |

පිටු අංක 7 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | Nishanka Edirisinghe ................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 28/02/2025 | දිනය : 2025.02.27 | දිනය : 2025.02.27 |
| ජේ.ආර්. උඩුවාවල | | ඩී.ඒ.බී.බී.බී. අලහකෝන් |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

*වගුව 3.3: මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය*

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | කතය | |
|---|---|---|
| | 2024<br>රු. | 2023<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 948,913,352 | 984,023,231 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 121,563,959 | 306,429,317 |
| අග්‍රිම ලැබීම් | 2,676,806,700 | 1,550,930,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 86,324,131 | 84,490,558 |
| තැන්පතු ලැබීම් | 876,916,902 | 942,775,949 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **4,710,525,045** | **3,868,649,054** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,052,280,053 | 1,754,760,539 |
| සහනාධාර සහ මාරුකිරීම් | 7,612,408 | 7,982,208 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 145,528,747 | 57,565,480 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 825,808,591 | 17,170,888 |
| අත්තිකාරම් ගෙවීම් | 83,390,507 | 78,135,041 |
| තැන්පතු ගෙවීම් | 849,975,478 | 1,064,108,073 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,964,595,784** | **2,979,722,230** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **745,929,260** | **888,926,824** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - |
| උපණය අයකර ගැනීම් | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 716,551,964 | 890,124,613 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **716,551,964** | **890,124,613** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(716,551,964)** | **(890,124,613)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **29,377,296** | **(1,197,789)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **29,377,296** | **(1,197,789)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**1. වාර්තාකරණ කාල පරිච්ඡේදය**

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාල වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

*වගුව 3.4: ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය*

රු.,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු). | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ %ලෙස |
| 1003: 07 :03 | පුද්ගලික ඉඩම් වලින් දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු | 130,000 | 130,000 | 112,137 | 86 |
| 2002: 01: 02 | රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම | 1,600,000 | 1,600,000 | 973,578 | 61 |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

*වගුව 3.5: වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය*

රු.,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,962,000 | 2,183,868 | 2,064,889.19 | 94.55 |
| ප්‍රාග්ධන | 703,000 | 728,000 | 716,551.96 | 98.42 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

*වගුව 3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන*

රු. ,000

| වැය ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 020 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම් ප්‍රතිපූර්ණය කිරිම සඳහා ලබාදීම. | 322.16 | 322.16 | 322.16 | 100 |
| 130 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රජයේ ආයතන සතු සංචාරක බංගලා හා නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ලබාදීම. | 166,929.19 | 166,929.19 | 64,282.88 | 38.50 |
| 160 | පරිසර අමාත්‍යාංශය | AFOLU ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දීම. | 6,820 | 6,820 | 5,912.67 | 86.69 |
| 161 | පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | තිරසර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටළු නිරාකරණය කිරීම වෙනුවෙන් ලබාදීම (උතුරු හා නැගෙනහිර පළාත්) | 29,000 | 29,000 | - | - |
| 166 | ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ වැඩසටහන සඳහා ලබාදීම (උඩවත්ත කැලේ රක්ෂිත වනාන්තරය) | 4,000 | 4,000 | - | - |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් ණයශේෂ නිරවුල් කිරීමට ලබාදීම. | 6,292.12 | 6,292.12 | 6,292.12 | 100 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පහල මල්වතු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදීම. | 86,527.2 | 68,727.2 | 68,718.90 | 99.98 |

## **3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

*වගුව 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම*

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 613,796.94 | 613,796.94 | - | - |
| 9152 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 577,397.50 | 577,397.50 | - | - |
| 9153 | ඉඩම් | 9,104,026.51 | 9,104,026.51 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 7,875.48 | 7,875.48 | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 84.54 | 84.54 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. : එෆ්ඩබ්එල්/ඊ/ඩීඑෆ්සී/02/එෆ්ජ්/2024/14
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2025 මැයි 30 දින

වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

(අ) ශේෂ පිරික්සුම අනුව දෙපාර්තමේන්තුව විසින් රැස් කර තිබූ රජයේ කැලෑවලින් ලැබෙන ආදායම (ආදායම් ශීර්ෂය - 2002-01-02) රු. 853,449,591 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 01 ආකෘතියේ එම ආදායම රු. 935,449,591 ක් ලෙස දක්වා තිබීමෙන් රු.82,000,000 කින් දෙපාර්තමේන්තුව විසින් රැස්කල ආදායම වැඩියෙන් දක්වා තිබුණි. තවද SA 21 පරිසණක මුද්‍රිත අනුව එම ආදායම් සංකේතය යටතේ වෙනත්

අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස් කල ආදායම රු.120,274,588 ක් වුවද, එය ඒසීඒ 01 ආකෘතියේ රු. 38,274,588 ක් ලෙස රු. 82,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඒසීඒ 01(i) හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙහි වර්ෂ ආරම්භක ශේෂය ලෙස දැක්විය යුත්තේ පසුගිය වර්ෂයේ හා ඊට පෙර වර්ෂයන්හි හිඟ මුදල්වල ආරම්භක ශේෂයන් පමණක් වුවද, එක් එක් වසරේ අවසාන ශේෂය ඊළඟ වසරේ ආරම්භක ශේෂ ලෙස ආරම්භක ශේෂ තීරුවේ දක්වා තිබීමෙන් හිඟ ආදායම්වල ආරම්භක ශේෂයේ මුළු එකතුව රු.2,069,474,187 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද එම ප්‍රකාශනයෙහි, වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් තීරුවෙහි සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදල් පමණක් දැක්විය යුතු වුවද, පසුගිය වසරෙහි හා ඊට පෙර වර්ෂයන්හි හිඟ ශේෂයන්ද එම තීරුවෙහි දක්වා තිබීමෙන් වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදලේ මුළු එකතුව රු. 218,637,752 ක් වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල හිඟ මුදල සමාලෝචිත වර්ෂයේදීම අය කර ගැනීමක් සිදු නොවන නමුත් ඒසීඒ 1(i) හි සාවද්‍ය ලෙස වාර්තා කරනු ලබන වර්ෂයට අදාල හිඟ මුදල් අය කිරීම රු.3,882,476 ක් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවලට අදාල සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ (ඒසීඒ-1) හිඟ ආදායම් රැස්කිරීම් කිසිවක් දක්වා නොතිබූ නමුත් හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-1(i)) හිඟ ආදායම් අයකර ගැනීම්වල එකතුව ලෙස රු.1,750,652,632 ක් දක්වා තිබුණි.

(ඉ) 2009 සිට 2019 දක්වා වර්ෂවල සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම හා වනජ ද්‍රව්‍ය වෙනුවෙන් අයවිය යුතු රු. 317,624,265 ක ආදායම්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණ අතර, ඒවා ඒසීඒ 01 (i) හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

### 1.6.2 පුනරාවර්තන වියදම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒසීඒ 2(i) ආකෘතියෙහි වැය විෂයය 1101 - දේශීය ගමන් වියදම් ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් රු. 8,830,000 ක් දක්වා තිබුණද, වර්ෂය තුලදී එවැනි මාරු කිරීමක් සිදුකර නොතිබූ අතර, වැය විෂයය 1409 - වෙනත් සේවා වියදම් ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් රු. 9,200,000 ක් දක්වා තිබුණද, සත්‍ය වශයෙන් එම වැය විෂය යටතේ මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් රු.3,800,000 ක් විය.

(ආ) අග්‍රිම ගැලපුම් ප්‍රකාශය අනුව වෙනත් ආයතන විසින් වාර්තා කරන ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් එකතුව රු. 4,996,735 ක් වුවත්, එය වියදම් පිළිබඳ ප්‍රකාශය ඒසීඒ 2(ii) හි මු.රෙ.208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම් තීරුවට එක් එක් වැය විෂයය යටතේ ඇතුළත් නොකර මුදල් පොතට අනුව වියදම් තීරුවට එකතු කර දක්වා තිබුණි.

### 1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 52 අනුව අනිකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම්වල වටිනාකම රු.10,297,208 ක් වුවද, අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය තුල එය රු. 10,130,804 ක් ලෙස රු.166,404 ක් අඩුවෙන් ගලපා තිබුණි.

### 1.6.4 මූල්‍ය නොවන වත්කම්

(අ) සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (එස්ජ් 82) අනුව 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් අයිතම 06 ක ශේෂයන්වල එකතුව රු. 4,714,970,273 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එම ශේෂයන්වල එකතුව රු.9,159,853,958 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.4,444,883,685 ක් වැඩියෙන් දැක්විණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 2021 ඔක්තෝබර් 30 දින සිට මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ එකතු වටිනාකම රු. 69,975,000 ක් වූ කැබ් රථ 05 ක් ලබාගෙන තිබූ අතර, ඒවා සිගාස් (CIGAS) වැඩසටහන මඟින් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (එස්ජ් 82) ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස වත්කම් අයිතම 03 කට අදාලව එකතුව රු. 4,711,937 ක් දක්වා තිබුණද, ඒවා තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි.

(ආ) 2023 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබූ ඩ්‍රෝන කැමරා 06 ක ලංසු ලේඛන විගණනය වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීමෙන් එම ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙහි නිවැරදිතාව පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය (එස්ජ් 82) අනුව 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් අයිතම 06 ක ශේෂයන්වල එකතුව රු. 4,714,970,273 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එම ශේෂයන්වල එකතුව රු.9,159,853,958 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.4,444,883,685 ක් වැඩියෙන් දැක්විණි. | 1.6.4 (අ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | 2023 වර්ෂයේ හිඟ ආදායම් වාර්තාවෙහි වර්ෂය අවසාන හිඟ ආදායම රු.2,095,359,351ක් ලෙස දක්වා තිබුණ ද, 2022 වර්ෂයේ හිඟ ආදායම් වාර්තාව අනුව ගැලපීම් කිරීමේදී වර්ෂය ආරම්භයේ පැවතිය යුතු හිඟ ආදායම වන රු.447,426,633 ට 2023 වර්ෂයේ හිඟ ආදායම් ප්‍රකාශනයෙහි පෙන්වා ඇති 2023 වර්ෂය සඳහා හිඟ ආදායම රු.455,286,391ක් හා වර්ෂය තුළ අයකර ගැනීම් රු.1,106,450,075ක් ගැලපීමෙන් පසු වර්ෂය අවසානයට හිඟ ආදායම ඉක්මවා රු.203,737,051ක වැඩිපුර අයකර ගැනීමක් නිරූපනය වේ. ඒ අනුව වර්ෂය අවසානයට පෙන්වා ඇති රු.2,095,359,351 ක හිඟ ආදායමේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි වූ අතර වර්ෂ ගණනාවක සිට හිඟ ආදායම් වාර්තා නිවැරදිව සකස් නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | 1.6.1(ආ) |
| 1.6.1 (ආ) | රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් (2002.01.02) ශීර්ෂය යටතේ වෙනත් ආයතන විසින් රැස්කර තිබූ ආදායම රු. 862,957,755 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.717,332,835 ක් ලෙස දක්වා තිබීමෙන් රු.145,624,920 ක වෙනසක් නිරීක්ෂණය විය. | 1.6.1 (ඇ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 2002-01-02 යටතේ රජයේ කැලෑවලින් ලැබෙන ආදායම මූලිකව රු. 1,600,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද, වර්ෂය තුළදී රු. 973,578,228 ක් පමණක් රැස් කරගෙන තිබීම හේතුවෙන් රු. 626,421,772 කින් හෙවත් සියයට 39 කින් ආදායම් සීමාව ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

### 3.2 වියදම් කළමනාකරණය

(අ) ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදි පුරෝකථනයන් සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක ශුද්ධ ප්‍රතිපාදනයේ එකතුව වූ රු. 13,800,000 න් රු. 4,303,552 ක් එනම් සියයට 28 ක් හා සියයට 74 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයක ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.6,900,000 න් රු. 4,020,767 ක්, එනම් සියයට 58 ක ඉතිරිවීම් පැවතුණි.

(ආ) මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී අධි ඇස්තමේන්තු සකස් කර තිබීම හේතුවෙන් පුනරාවර්ථන වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු. 1,198,000,000 කින් රු. 39,894,300 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන් වෙත මාරුකර තිබියදී, 2024 දෙසැම්බර් 31 දිනට එම වැය විෂයන්ගේ තවදුරටත් රු.106,381,625 ක් එනම් සියයට 5 ත් සියයට 58 ත් අතර පරාසයක ඉතිරිවීම් පැවතීණි.

**3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අවස්ථා 68 කදී රු. 1,709,272 ක වියදම් 2025 පළමු මාස 02 ක තුලදී නිරවුල් කර තිබුණු අතර මෙම වියදම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි.

**3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතාව ඉටු කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි.

**3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත | | |
| | 224 වගන්තිය | - | ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් කටයුතු සිදුකර විධිමත්ව පවරා ගැනීමට කටයුතු සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටෙයාර 79.38 ක ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| i. | රෙගුලාසි 396 | 974,058 | බැංකු ගිණුම් 11 කට අදාලව 2024 දෙසැම්බර් 31 වන විට නිකුත් කර මාස 06 ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ii. | රෙගුලාසි 571 | - | සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේදී කල් ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| iii. | රෙගුලාසි 571(3) | 327,280,296 | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 02 ක් ඉක්මවූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | - | භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණය කිරීම සඳහා අදාල මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම, ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම ,ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා දීම හා ජුනි 15ට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීම සිදුකල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024 සැප්තැම්බර් 30 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් සිදු කෙරෙමින් පැවතුණි. |

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

(අ) 2023 වර්ෂයේදී අවසන් වූ පරිසර පද්ධති සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතියට අදාල නිල බැංකු ගිණුම් 33 ක් අක්‍රීයව පැවතියද, 2024 දෙසැම්බර් 31 දිනට ඒවා මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණු අතර එම ගිණුම් වසා දැමීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට එක් බැංකු ජංගම ගිණුමකට අවස්ථා 36 කදී සෘජුව බැරවී තිබූ රු.34,610,497 ක් සම්බන්ධයෙන් කාලීනව පොත්පත් හා ලේඛන සමග සැසඳීම් කර හඳුනා නොගැනීම නිසා මුදල් පොතට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

(අ) වන සංරක්ෂණ ආඥා පනතේ 3(2) ආඥාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර 512 ක් සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කර තිබුණද, එම සැලසුම් වලින් සැලසුම් 459 ක් අනුමත කර නොතිබීම නිසා ආඥා පනතේ 3(3) ආඥාව අනුව එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ මූලික අරමුණු, වන ජෛව විවිධත්වය, පස සහ ජලය සංරක්ෂණය, ජාන සම්පත හා දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන හා සත්ත්ව හා වෘක්ෂලතා විශේෂ සුරක්ෂිත කිරීම වුවද, වනාන්තර 897 ක් රක්ෂිත හා සංරක්ෂිත ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර වර්ෂ 01 ත් 19 ත් දක්වා වූ දීර්ඝ කාලයක් ගත වී තිබුණද, එම කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක නොවීම මත රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ ඉහත අරමුණු ඉටු වී නොතිබුණි.

#### 4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

ගම්පහ දිසාවට අයත් ගම්පහ අඩවියේ වනාන්තර 13 ක් හා මීරිගම අඩවියේ වනාන්තර 19 ක් GPS තාක්ෂණය මගින් හා මැනුම් දෙපාර්තමේන්තුව විසින් මැනුම් කර ඇතත්, විගණන දිනය වූ 2025 ජනවාරි 24 තෙක් රක්ෂිත සහ සංරක්ෂිත ලෙස ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2024 දෙසැම්බර් 17 දින සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

(අ) දෙපාර්තමේන්තුව විසින් රු.3,463,800 ක් වැය කර ඩ්‍රෝන කැමරා 06 ක් 2023 දෙසැම්බර් මස මිලදී ගෙන තිබූ අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ, මාර්ගෝපදේශ 6.3.1(ඇ) ප්‍රකාරව ලංසු ලේඛන පිටපත් 02 කින් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී නොතිබුණු අතර මාර්ගෝපදේශ 5.3.11 ප්‍රකාරව ලබා ගත යුතු ලංසු සුරක්ෂණ ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 18 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත එකක් රු. 502,000 (වැට් රහිත) මිලකට ඩ්‍රෝන කැමරා 05 ක් මිලදී ගැනීමට 2023 දෙසැම්බර් 18 දිනැති ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණද එකී සීමාව ඉක්මවා ඩ්‍රෝන කැමරා 06 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 27 දින ප්‍රධාන කාර්යාලයට ලැබී තිබූ ඩ්‍රෝන කැමරාවක් ත්‍රිකුණාමල දිසාවන කාර්යාලයට භාර දීමට මාස 06 ක කාලයක් ගත කර තිබීමෙන් වසරක වගකීම් කාලයක් සහිතව මිලදී ගෙන තිබූ මෙම කැමරාව වගකීම් කාලයෙන් හරි අඩක් ගෙවී යන තෙක් භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) ඩ්‍රෝන කැමරා භාවිතය පිළිබඳව විධිමත් පුහුණුවක් නිලධාරීන්ට ලබා දීමට සහ ඒවායේ නඩත්තු හා සේවා කිරීම් සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවධානය යොමු කර නොතිබූ අතර, ඒ සම්බන්ධව ලංසු ලේඛනවල විධිවිධාන ඇතුළත් කර නොතිබුණි.

4.3 **වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුව සතු ධාවනයෙන් තොරව පවතින රු. 14,035,000 ක් පිරිවැය වූ වාහන 143 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 **පාඩු හා හානි**

(අ) 2017 සිට 2023 දක්වා වූ කාලය තුල සිදුව තිබූ රු. 1,037,314 ක් වූ හානි හා පාඩු සිද්ධි 10 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත්, 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 11 ක කාලය තුල සිදු වූ රු. 5,493,264 ක්වූ හානි හා පාඩු සිද්ධි 15 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමටත් 2025 අප්‍රේල් 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 10 ක කාලය තුල මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර ඇති රු. 2,562,343 ක් වූ අලාභ හානි සිද්ධි 14 ක් සඳහා මුදල් රෙගුලාසි 109 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 109 (1) ප්‍රකාරව 2023,2024 හා 2025 වර්ෂවල පරීක්ෂණ කටයුතු අවසන් වූ රු. 5,542,174 ක්වූ අලාභ හානිවලට අදාළව පිළියෙල කරන ලද පොදු 285 වාර්තා මගින් පොතෙන් අස් කිරීමේ නියෝගය ලබා ගැනීම වෙනුවෙන් මු.රෙ. 108 හි දැක්වෙන බලය පැවරී ඇති අමාත්‍යාංශ ලේකම් හා වන සංරක්ෂක ජනරාල් වෙත යොමු කර ඇතත්, අදාළ පොතෙන් අස් කිරීමේ නියෝගය ලැබී නොමැති සිද්ධි 5 ක් පැවතුණි.

(ඇ) 2022 හා 2024 වර්ෂවලදී සිදු වූ පාඩු හා අලාභ හානි සිද්ධීන් 03 ක අලාභය 2025 අප්‍රේල් 11 දින වන විටත් තක්සේරු කර නොතිබුණි.

4.5 **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

2024 ගිණුම් වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 06 ක් සඳහා මාස 01 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබුණ ද පිළිතුරු ලබා දී නොතිබුණි.

**4.6 කළමනාකරණ දුර්වලතා**

(අ) 2025 ජනවාරි 24 දින ගම්පහ දිසාවට අයත් අලවල සංරක්ෂිතය භෞතික විගණන පරීක්ෂාවට ලක් කිරීමේදී අවිධිමත් ලෙස ඉවත් කර තිබූ ප්ලාස්ටික්, පොලිතීන් හා වෙනත් නොදිරන කසල සංරක්ෂිතයට හා ආශ්‍රිත ඇල මාර්ග වලට බැහැර කර තිබූ අතර, එම අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ හේතුවෙන් ස්වාභාවික පරිසර පද්ධතින්ගේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණීම හා සංරක්ෂිතයේ තිරසර පැවැත්මට තර්ජනයක් වී තිබුණි.

(ආ) හොරකැලේ රක්ෂිත වනාන්තරය හෙක්ටයාර 15.15 ක වපසරියකින් යුක්ත වන අතර ඉන් 2018 වර්ෂයේ දි හෙක්ටයාර 10 ක ප්‍රමාණයක වන වගා සිදු කර තිබුණි. මෙම වන වගාව 2020 වර්ෂයේ පෙබරවාරි 23 සහ 24 දෙදින තුල හෙක්ටයාර 03 ක් හා පර්චස් 60 ක් ද ,2022 වර්ෂයේ මාර්තු 05 දින හෙක්ටයාර 04 ක් ද ගිණිගෙන තිබූ අතර 2023 වර්ෂයෙන් පසුව ගිණිපටි නඩත්තු කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඇ) මාළිගාවත්ත රක්ෂිත වනාන්තරයේ අක්කර 46 ක ප්‍රමාණයක සහ හොරකැලේ රක්ෂිත වනාන්තරයේ අක්කර 7.78 ක පමණ භූමි ප්‍රමාණයක ආක්‍රමණශිලි ශාක විශේෂයක් වන ඇකේෂියා වගාවෙන් සම්පූර්ණයෙන්ම වැසිගොස් තිබුණු අතර එය පාලනය කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) හෙක්ටයාර 32 ක වපසරියකින් යුක්තවන අලවල රක්ෂිත වනාන්තරයේ පයිනස් වගාව සම්බන්ධයෙන් අවසන් වරට ගණනය කළ 2009 වර්ෂය වන විට එහි පයිනස් ගස් 35,520 ක ප්‍රමාණයක් පැවතුණි. 1974 වර්ෂයේ වගා කර තිබූ මෙම පයිනස් වගාව විගණිත දිනය වූ 2025 ජනවාරි 24 දින වන විට වසර 50 ක කාලයක් ඉක්ම වූ වන වගාවක් වූ අතර, වන වගාව අලෙවි කිරීමට කටයුතු කර නොමැති වීමෙන් වර්තමානය වන විට පයිනස් ගස් ස්වාභාවිකව මියයාමට ඉඩ සලස්වා තිබුණි. දෙපාර්තමේන්තුවේ දැක්ම, රටවැසියාගේ හා ජාතික ආර්ථිකයෙහි හිත සුව පිණිස දැව හා වෙනත් ද්‍රව්‍ය සඳහා වැඩි වන ඉල්ලුම මෙන්ම මනා පාරිසරික සේවාවක් පවත්වා ගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසර අයුරින් කළමණාකරනය කිරීම වුවද, වැඩි වන දැව ඉල්ලුම පිළිබඳ අවබෝධයක් ලබාගෙන එම වගාවන් අලෙවි කිරිමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඉ) ගම්පහ දිසාවට අයත් මීතිරිගල රක්ෂිතය 1895 මැයි 22 දින රක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් කර තිබුණු අතර එහි ඉඩම් කොටස් 76 ක් අනවසරයෙන් අල්ලා ගැනීම හේතුවෙන් 2018-2021 දක්වා කාලය තුල අස්කිරීම් නියෝග ඉදිරිපත් කර තිබුණි. මෙම අස්කිරීම් දැන්වීම් සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් එම අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීම වෙනුවට එම ගැටළු සහිත භූමිය රක්ෂිත භූමියෙන් ඉවත් කර 2021 අප්‍රේල් 08 දින නැවත ගැසට් කිරීමට ක්‍රියාකිරීම තුල හෙක්ටයාර 44.9ක් හෙවත් අක්කර 112 ක වනාන්තර ප්‍රමාණයක් මීතිරිගල රක්ෂිතයට අහිමිවී තිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුවේ හිඟ සේවක ණය තුල අවුරුදු 01ට වැඩි මිය ගිය නිලධාරීන් 13 දෙනෙකුගේ රු.1,166,806 ක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 30 කගෙන් රු.2,537,628 ක් ද, වැඩ තහනම් කර ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු. 2,331,959 ක් ද, සේවය හැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,509,343 ක් ද වශයෙන් එකතුව රු. 7,545,736 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

5 **තිරසර සංවර්ධනය**

**තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

තිරසර සංවර්ධන ඉලක්ක යටතේ කදුකර ජෛව විවිධත්වය සඳහා වැදගත් ආරක්ෂිත ප්‍රදේශ/භූමි ආවරණය සිදු කිරීමට හඳුනාගෙන තිබුණද, 2024 වර්ෂයේ මෙම තිරසර සංවර්ධන ඉලක්කය ඉටු කර ගැනීම සඳහා කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි.

6. **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ රු.3,259 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් 564 ක් පුරප්පාඩුව පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 25 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 26ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 113 දෙනෙකු හා බීට්ටු වන නිළධාරීන් 166 දෙනෙක් ද ඒ අතර විය. එම තනතුරු පුරප්පාඩුව පැවතීම ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැලැක්වීම හා දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි සෘජුවම බලපෑ හැකිව තිබුණි.

H.S.S.P.

එච්.එස්. එස්.පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති (වැ.බ.) වෙනුවට.

# 04 පරිච්ඡේදය කාර්යසාධන දර්ශක

## 4.1 කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යසාධක දර්ශක පහත පරිදි වේ)

*වගුව 4.1 : කාර්යසාධන දර්ශක*

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස(%) නිමැවුම තත්‍ය | | |
|---|---|---|---|---|
| | | 100%- 90% | 75%-89% | 50%- 74% |
| 1 | ගොඩනැගිලි 31ක් හා ව්‍යුහයන් නඩත්තු කිරීම | 100% | - | - |
| 2 | වාහන නඩත්තු කිරීම (වැය ශීර්ෂ අංක 014) | 99% | - | - |
| 3 | ඉන්ධන ලබාගැනීම (වැය ශීර්ෂ අංක 009) | 99% | - | - |
| 4 | වාහන අලුත්වැඩියාව (වැය ශීර්ෂ අංක 203) | 100% | - | - |
| 5 | උපකරණ හා යන්ත්‍ර ලබා ගැනීම | 100% | - | - |
| 6 | කාර්යාල හා විද්‍යුත්උපකරණ නඩත්තු කිරිම | 99% | - | - |
| 7 | මෘදුකාංග සංවර්ධනය | 100% | - | - |
| 8 | වන ආවරණය ඉහළ නැංවීම යටතේ හෙක්ටයාර 3654.4ක භූමි ප්‍රමාණයක ස්වාභාවික පුනර්ජනනය වේගවත් කිරිමට අදාල නඩත්තු සිදු කිරීම | 100% | - | - |
| 9 | ආගමික ස්ථාන වල රුක් රෝපණ නඩත්තු - හෙක්ටයාර 04 ක(අනුරාධපුර මහමෙව්නා උයන) | 100% | - | - |
| 10 | හෙක්.326.6ක කඩොලාන ප්‍රතිස්ථාපන හා නඩත්තු කටයුතු සිදු කර ඇත. | 100% | - | - |
| 11 | හෙක්. 47ක රණවිරු රුක්රෝපණය හා නඩත්තුව | 100% | - | - |
| 12 | හෙක්. 622.32 ක වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත ඉඩම් නඩත්තු කිරීම. | 90% | - | - |
| 13 | හෙක්.130ක වනාන්තර බවට පත් කළ අතහැර දමන ලද ගෙවතු ඉඩම් නඩත්තු කිරීම | 90% | - | - |
| 14 | හෙක්.180ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම හා නඩත්තු කිරීම | 100% | - | - |
| 15 | වැව් තාවුළු සංරක්ෂණය යටතේ වැව් ආශ්‍රිතව හෙක්. 156.6ක දේශීය ශාක සිටුවා සංරක්ෂණය හා නඩත්තු කටයුතු සිදු කිරීම | 100% | - | - |
| 16 | ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කර ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ගිනි පටි කැපීම හා නඩත්තු කටයුතු සිදු කර ඇත. | 97% | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 17 | වන ආරක්ෂණය සඳහා වන අපරාධ මැඩලීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අවශ්‍ය වන වියදම් පියවීම<br>I. ඩ්‍රෝන යන්ත්‍ර 06ක් මිලදී ගැනීම හා රක්ෂණය කිරීම<br>II. විශේෂ විමර්ශන රාජකාරි සඳහා ඉන්ධන සැපයීම<br>III. සිංහරාජ රක්ෂිතයේ හදිසි මෙහෙයුම් කටයුතු සඳහා වියදම්<br>IV. අඩවි වන නිලධාරීන් සඳහා නිලධාරීන් 105ක් දින 04ක් සඳහා වන ආරක්ෂණ පුහුණුව | 100% | - | - |
| 18 | ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 197 ක් සකස් කිරීම. | 100% + | - | - |
| 19 | වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02 ක් පැවැත්වීම (දකුණ /සබරගමුව කලාපය , වයඹ /බස්නාහිර කලාපය) | - | - | 40% |
| 20 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නකල්ස් සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම | - | - | 60% |
| 21 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සිංහරාජ සංරක්ෂිතය ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන හා අධීක්ෂණ රැස්වීම් පැවැත්වීම | - | - | 40% |
| 22 | කිලෝමීටර් 960 ක වනාන්තර මායිම් GPS මඟින් මැනුම් කිරීම | 100% | - | - |
| 23 | කිලෝමීටර් 310ක වනාන්තර මායිම් වල කණු සිටුවීම | 100% | - | - |
| 24 | ජාතික වන සංගණන නියැදි 777 ක දත්ත ලබා ගැනීම | 100% | - | - |
| 25 | හෙක්.107.4ක ගොවි වන වගා ස්ථාපනය සිදුකිරීම | - | 70% | - |
| 26 | හෙක්. 834.8ක ස්ථාපිත ගොවි වන වගා පවත්වාගෙන යාම / නඩත්තු කටයුතු. | 98% | - | - |
| 27 | තවාන් පැළ නඩත්තුව (පැළ 900,000) | 100% | - | - |
| 28 | වන ව්‍යාප්ති වැඩසටහන් 1000ක් පැවැත්වීම. | 100% | - | - |
| 29 | ගෙවතු සංවර්ධන වැඩසටහන් 11,360ක් පැවැත්වීම. | 100% | - | - |
| 30 | බීජ පැළ 405,500ක් නිෂ්පාදනය කිරීම. | 100% | - | - |
| 31 | පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් සිදු කිරීම. | 100% | - | - |
| 32 | කි.මී.20ක මාර්ග දෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 100% | - | - |
| 33 | නාගරික තුරු ගොමු 4ක් ස්ථාපනය සිදුකිරීම. | 100% | - | - |
| 34 | වනාන්තර වලින් පිටත රුක් රෝපණ වැඩසටහන් 23ක් පැවැත්වීම. | 100% | | |

| | | | | |
|---|---|---|---|---|
| 35 | හෙක්. 177.24ක වාණිජ වන වගා ස්ථාපිත කිරීම (RCT) | 98.88% | - | - |
| 36 | හෙක්. 4407 ක නොමේරූ වනවගා නඩත්තුව | 95.63% | - | - |
| 37 | හෙක්. 40ක කැබිලිත්ත වන වගා නඩත්තු කටයුතු සිදු කිරීම | 100% | - | - |
| 38 | පාරිසරික සංචාරක ගමනාන්ත 16 ක, සංචාරක පහසුකම් වැඩි දියුණු කරමින් නඩත්තු කටයුතු සිදු කර ඇත. | 96% | - | - |
| 39 | සංචාරක බංගලා 04 ක පහසුකම් වැඩි දියුණු කර නඩත්තු කටයුතු සිදු කර ඇත. | 100% | - | - |
| 40 | ප්‍රවේශ පත්‍ර කවුළු 09 ක නඩත්තු කටයුතු සිදු කර ඇත. | 100% | - | - |
| 41 | සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්ණායකයන්ට අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින සංචාරක බංගලා 8ක් නවීකරණය කිරීම | 96% | - | - |
| 42 | පාරිසරික සංචාරක ස්ථානයන්හි ස්වභාවික මංපෙත් සංවර්ධනය කර නඩත්තු කිරීම<br>ස්වභාවික මංපෙත් - 98.6km | - | 75% | - |
| 43 | පාරිසරික සංචාරක ස්ථානයන්හි සෆාරි මාවත් සංවර්ධනය කර නඩත්තු කිරීම<br>සෆාරි මාවත් - 105km | 100% | - | - |
| 44 | පවත්නා පර්යේෂණ නඩත්තු කිරීම. | 91% | - | - |
| 45 | නව අත්හදා බැලීම්, පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය කිරීම. | 100% | - | - |
| 46 | පර්යේෂණ වාර්තාවක් (ප්‍රවෘත්ති ලිපියක්) සහ පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම | 100% | - | - |
| 47 | බීජ මූලාශ්‍ර සංවර්ධනය කිරීම | 100% | - | - |
| 48 | පර්යේෂණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම-කුඹල්පොල | 100% | - | - |
| 49 | පර්යේෂණ මධ්‍යස්ථාන නඩත්තු කිරීම-බදුල්ල | - | 80% | - |
| 50 | සාමාජික ගාස්තු ගෙවීම | - | 80% | - |
| 51 | ශ්‍රී ලංකා වන විද්‍යායතනය<br>දේශන -22 | 100% | - | - |
| 52 | ප්‍රායෝගික පරීක්ෂණ - 20 | 100% | - | - |
| 53 | විභාග - 02 | 100% | - | - |
| 54 | නඩත්තු කටයුතු සිදු කිරීම-නුවරඑළිය හා ඉනාමළුව | 100% | - | - |
| 55 | ධාරිතා සංවර්ධන<br>වන ක්ෂේත්‍ර සහකාර ප්‍රේරක පුහුණුව | 100% | - | - |
| 56 | ශාක විශේෂ කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම | 100% | - | - |
| 57 | දෙමළ භාෂා පුහුණුව | - | 75% | - |
| 58 | වෙනත් පුහුණු වැඩසටහන් | - | 80% | - |

# 05 පරිච්ඡේදය
# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

*වගුව 5.1: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය*

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්කය | දෙපාර්තමේන්තු ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය,තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණය ට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම | 15.1. 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධතිය සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන් විශේෂ වනාන්තර කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නඟා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. | 2030දී 32% දක්වා වන ආවරණය වැඩි කිරීම | | | | |
| | | 2024 ඉලක්ක | | | | |
| | | 1. කි.මී. 310ක වනාන්තර මැනීම් හා මායිම් සලකුණු කිරීම. | - | - | - | 100% |
| | | 2. පවත්නා පර්යේෂණ නඩත්තු කිරීම. (හෙක්ටයාර 40.4ක) | | - | - | 91% |
| | | 3. නව අත්හදා බැලීම්, පර්යේෂණ ස්ථාපනය හා සංවර්ධනය කිරීම.(පර්යේෂණ 04) | | - | - | 100% |
| | | 4. බීජ මූලාශ්‍ර සංවර්ධනය කිරීම හෙක්ටයාර 13 හා 16) | | - | - | 100% |
| | 15.2. 2020 වන විට සියළුම වර්ග වල වනාන්තර තිරසර අන්දමින් කළමණාකරණ ය කිරීම, ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා | 1. හෙක්. 47ක රණවිරු රුක්රෝපණය හා නඩත්තු සිදු කිරීම. | වගා කරන ලද භූමිය. | - | - | 93% |
| | | 2. කඩොලාන සංරක්ෂණය යටතේ හෙක්. 326.6ක කඩොලාන වනාන්තර | කඩොලාන සංරක්ෂණය කරන ලද භූමිය. | - | - | 90% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | තත්ත්වයට පත් කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගා වර්ධනය කිරීම. | නඩත්තු කටයුතු සිදු කිරීම | | | | |
| | | 3.වැව් තාවුළු සංරක්ෂණය යටතේ පෙර වසරවලදී ස්ථාපිත වැව් තාවුළු ආශ්‍රිත වන භූමි නඩත්තු සිදු කිරීම. හෙක්. 156.6 | සංරක්ෂණය කරන ලද වැව් තාවුළු. | - | - | 90% |
| | | 4. හෙක්. 179<br>5. .24 වානිජ වන වගා ස්ථාපිත කිරීම. ( RCT) | හෙක්ටයාර් 177.24 ක් වානිජ වනවගා ස්ථාපිත කිරීම | | | 98.88 % |
| | | 6. ස්වභාවික පුනර්ජනනීය වනාන්තර ස්ථාපනය සහ ස්වභාවික පුනර්ජනනීය වනාන්තර නඩත්තු හෙක්ටයාර් 3654.4 | වනාන්තර ප්‍රතිස්ථාපිත භූමිය. | - | - | 80% |
| | | 7. හෙක්.622.3 ක කටුපඳුරු සහිත ඉඩම්වල ස්ථාපිත වනවගා නඩත්තු කිරීම | වනාන්තර බවට පත් කළ කටු පඳුරු සහිත භූමිය | - | - | 89% |
| | | 7. හෙක් 130 ක අත්හරින ලද ගෙවතු වල ස්ථාපිත කරන ලද වනාන්තර නඩත්තු කිරිම | වනාන්තර බවට පත් කළ අතහැර දමන ලද ගෙවතු සහිත භූමිය | - | - | 90% |
| | | 8. හෙක් 4 ක ආගමික ස්ථාන වල රුක් රෝපණය නඩත්තු. | වන වගා කරන ලද භූමිය | - | - | 92% |
| | | 9. ගිනි නිවීමේ ඒකක ස්ථාපිත කර දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ගිනි පටි ස්ථාපනය කිරීම | ගිනි පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ගිනි පටි ස්ථාපනය කිරීම | - | - | 90% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 10.ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 50ක් සකස් කිරීම | ස්වාභාවික වනාන්තර සඳහා නව වන කළමනාකරණ සැලසුම් 197ක් සකස් කිරීම | - | - | 100% + |
| | | 11.වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 05ක් පැවැත්වීම (උතුරු මැද නැගෙනහිර කලාපය, උතුරු කලාපය, දකුණු/සබරගමුව කලාපය, වයඹ බස්නාහිර කලාපය, මධ්‍යම ඌව කලාප සඳහා) | වන කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02ක් පවත්වා ඇත. (දකුණු/සබරගමුව කලාපය, වයඹ/බස්නාහිර කලාපය) | 40% | - | - |
| | | 12.හෙක්. 153ක කෘෂි වන වගා ස්ථාපනය කිරීම | හෙක්. 107.4ක කෘෂි වන වගා ස්ථාපනය කිරීම | - | 70 % | - |
| | | 13. හෙක්. 834.8 ක ස්ථාපිත කෘෂි වන වගා නඩත්තු කිරීම | හෙක්. 819.8 ක ස්ථාපිත කෘෂි වන වගා නඩත්තු කිරීම | - | - | 98% |
| | | 14. වන ව්‍යාප්ති වැඩසටහන් 500ක් පැවැත්වීම. | වන ව්‍යාප්ති වැඩසටහන් 944ක් පැවැත්වීම. | - | - | 100% |
| | | 15.ගෙවතු සංවර්ධන වැඩසටහන් 11,360ක් පැවැත්වීම. | ගෙවතු සංවර්ධන වැඩසටහන් 11,360ක් පැවැත්වීම. | - | - | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 16.පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් 500ක් සිදු කිරීම. | පාසල්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවල රුක් රෝපණ වැඩසටහන් 628ක් සිදු කිරීම | - | - | 100% |
| | | 17.හෙක්.4608 ක වානිජ වන වගා නඩත්තුව සිදු කිරීම | හෙක්.4407 ක වනවගා නඩත්තු කිරීම | - | - | 95.63 % |
| | | 18.හෙක්. 40ක කැබිලිත්ත වන වගා නඩත්තු කටයුතු සිදු කිරීම. | හෙක්ටයාර් 40 ක කැබිලිත්ත වනවගා නඩත්තුව | - | - | 100% |
| | | 19.කි.මී.20ක මාර්ගදෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | කි.මී.20ක මාර්ගදෙපස රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | - | - | 100% |
| | | 20. නාගරික තුරු ගොමු ස්ථාපනය සිදුකිරීම. | නාගරික තුරු ගොමු 4ක් ස්ථාපනය සිදුකිරීම | - | - | 100% |
| | | 21. වනාන්තරවලින් පිටත රුක් රෝපණ වැඩසටහන් 23ක් පැවැත්වීම | වනාන්තරවලින් පිටත රුක් රෝපණ වැඩසටහන් 23ක් පැවැත්වීම | - | - | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 22.. පාරිසරික සංචාරක ගමනාන්ත 16 ක, සංචාරක පහසුකම් වැඩි දියුණු කරමින් නඩත්තු කටයුතු සිදු කිරීම | සංචාරක ගමනාන්ත 16<br>1. සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථාන, කුඩව සහ පිටදෙනිය<br>2. කන්නෙලිය<br>3. උඩවත්ත කැලේ<br>4. නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථාන, මහනුවර සහ මාතලේ<br>5. බඩගමුව<br>6. කුරුළු කැලේ<br>7. මාකන්දාව<br>8. බඹරගල<br>9. ඇල්ලගල<br>10. ඔහිය<br>11. මන්දාරම් නුවර<br>12. කන්දෙ ඇල<br>13. හුරුළු පාරිසරික උද්‍යානය<br>14. ගල්ඔය පාරිසරික උද්‍යානය<br>15. ගල්විල පාරිසරික උද්‍යානය<br>16. අඬාහැලෙන ඇල්ල | - | - | 96% |
| | | 23. සංචාරක බංගලා 04 ක පහසුකම් වැඩි දියුණු කර නඩත්තු කටයුතු සිදු කර | 1. කොස්ගුලන වන නිවහන<br>2. හිරිකටු ඔය කඳවුරු භූමිය<br>3. දෝතළුගල කඳවුරු භූමිය<br>4. මානිගල වන නිවහන | - | - | 100% |
| | | 24. ප්‍රවේශ පත්‍ර කවුළු 09 ක නඩත්තු කටයුතු සිදු කර ඇත. | තන්ගප්පුව ප්‍රවේශ පත්‍ර කවුළුව<br>2. දවටගල ප්‍රවේශ පත්‍ර කවුළුව<br>3. රත්න ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව<br>4. රිවර්ස්ටන් ප්‍රවේශ පත්‍ර කවුළුව<br>5. සේර ඇල්ල ප්‍රවේශ පත්‍ර කවුළුව<br>6. මන්දාරම් නුවර ප්‍රවේශ පත්‍ර කවුළුව<br>7. හුරුළු | - | - | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රවේශ පත්‍ර කවුළුව 8. පොල්ලේබැද්ද ප්‍රවේශ පත්‍ර කවුළුව 9. අකුල්බොඩ ප්‍රවේශ පත්‍ර කවුළුව | | | |
| | | 25. සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්ණායකයන්ට අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින සංචාරක බංගලා 8ක් නවීකරණය කිරීම | | - | - | 96% |
| | | 26. පාරිසරික සංචාරක ස්ථානයන්හි ස්වභාවික මංපෙත් සංවර්ධනය කර නඩත්තු කිරීම ස්වභාවික මංපෙත් 98.6km | | - | - | 75% |
| | | 27. පාරිසරික සංචාරක ස්ථානයන්හි සෆාරි මාවත් සංවර්ධනය කර නඩත්තු කිරීම සෆාරි මාවත් - 105km | | - | - | 100% |
| | 15.8. 2020 වන විට ගොඩබිම සහ ජලයේ පරිසර පද්ධති වල වෙසෙන ආක්‍රමණික පිටස්තර ජීව විශේෂයන් අලුතින් හඳුන්වාදීම සහ ඔවුන්ගෙන් සිදු වන බලපෑම කැපී පෙනෙන ලෙස අඩු කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වාදීම සහ මෙම විශේෂයන් පාලනය හෝ තුරන් කිරීම. | 1. හෙක්. 180ක ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම | ආක්‍රමණශීලී ශාඛ ඉවත් කිරීම හා එම ප්‍රදේශ නඩත්තු කිරීම. | - | - | 85% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 ජයග්‍රහණ

- සංචාරක සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද රුපියල් 131,793,198.26 ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින සංචාරක බංගලා 08 ක් (ඩීන්ස්ටන් සංචාරක බංගලාව, ඇල්ලගල සංචාරක බංගලාව, ඔහිය සංචාරක බංගලාව, උඩවත්තකැලේ සංචාරක බංගලාව, ගල්විල සංචාරක බංගලාව, මාතලේ රිවස්ටන් සංචාරක බංගලාව, යාපනය සංචාරක බංගලාව හා පිටදෙණිය නිවහන) නවීකරණය කරමින් සංචාරකරකයන්ට වඩාත් ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීමට කටයුතු කිරීමට හැකි වීම.

- පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් මඟින් 2023 වසරට වඩා වැඩි අදායමක් 2024 වසරේ ඉපයීමට හැකි වීම. එය 2023 වසරට 117%ක වැඩි වැඩි වීමකි. (2023 වසරේ පාරිසරික අංශය ලැබූ අදායම රු.මිලියන 207,959,792.77 ක් (අංශයට අයත් සංචාරක බංගලා ආදායමද සමඟ) වන අතර එය 2024 වසරේ රු.මිලියන 452,260,167.01 කි)

### 5.2.2 අභියෝග

i. වන ආවරණය වැඩි කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම

ii. වනන්තර මායිම් නිරූපණයේදී හා ගැසට් කිරීමේ දී විවිධ ආයතනයන්ගෙන් හා ප්‍රජාවගෙන් නිසි සහයෝගයක් නොලැබීම හා ජාතික වශයෙන් වැදගත් වන කටයුත්තක් සේ නොසලකමින් එම කාර්ය කෙරෙහි ඇතිවන ප්‍රතිරෝධතා

iii. වනාන්තර මායිම් මැනුම් කිරීම සහ මායිම් කණු මඟින් සලකුණු කිරීම දුෂ්කර කටයුත්තක් වන අතර එම කාර්ය සාර්ථකව ඉටු කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සේවක මණ්ඩලයේ ඌණතාවය.

iv. වනාන්තර මායිම් නිරූපණය හා ගැසට් කිරීමේ කාර්‍ය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන නිසි කලට හා නිසි ප්‍රමාණයෙන් නොලැබීම

# 06 පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

*වගුව 6. 1: සේවක සංඛ්‍යා කළමනාකරණය*

| | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 89 | 56 | 33 |
| තෘතීක මට්ටම | 44 | 9 | 35 |
| ද්විතීයික මට්ටම | 1492 | 1104 | 388 |
| ප්‍රාථමික මට්ටම | 1634 | 1394 | 240 |
| **එකතුව** | **3259** | **2563** | **696** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් බලපාන ආකාරය

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | - | දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති සැකසීම, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය හා පවත්වා ගැනීමේ හැකියාව කෙරෙහි දැඩි ලෙස බලපා ඇත |
| තෘතියික | - | දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන කණ්ඩායම මෙහෙයවීම හා අධීක්ෂණය කෙරෙහි බලපෑම් ඇති කරයි. |
| ද්විතියික | - | වන ආරක්ෂණ හා සංවර්ධන කටයුතු ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකි වීම. |
| ප්‍රාථමික | - | සුළු සේවක කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන් කාර්යාලීය කටයුතු කාර්යක්ෂමව කිරීමට නොහැක. වනාන්තර සහ නැවත වගාකරන වනාන්තරවල ආරක්ෂාවට මෙන්ම තවාන් කටයුතු හා සංරක්ෂණ මධ්‍යස්ථාන වල මෙම කාර්යාල කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට ගැටළු සහගත වීම. |

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### 2024 වසරේ බඳවා ගැනීම්

*වගුව 6. 2 : 2024 වසරේ බඳවාගැනීම්*

| | |
|---|---|
| සහකාර වන සංරක්ෂක | 23 |
| වන ක්ෂේත්‍ර සහකාර | 42 |

## 6.4 2024 වසරේ විශ්‍රාම ගැනීම්

අදාළ කාල වකවානුව තුළ පහත සඳහන් තනතුරු දරණ ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

*වගුව 6. 3: 2024 වසරේ විශ්‍රාම ගැනීම*

| | |
|---|---|
| අතිරේක වන සංරක්ෂක ජනරාල් (ශ්‍රී. ලං. වි. සේ.) | 01 |
| අතිරේක වන සංරක්ෂක ජනරාල් (ශ්‍රී. ලං. ප. සේ.) | 01 |
| අතිරේක අධ්‍යක්ෂ | 01 |
| වන සංරක්ෂක | 01 |
| සහකාර වන සංරක්ෂක | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| වන පාලක | 01 |
| සැලසුම් ශිල්පී | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 03 |
| අඩවි වන නිලධාරී | 03 |
| බීට්ටු වන නිලධාරී | 11 |
| වන ව්‍යාප්ති නිලධාරී | 05 |
| වගා කම්කරු | 12 |
| ජල යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| රිය සහායක | 01 |
| රියදුරු | 02 |
| කාර්යාල කාර්ය සහයක | 02 |
| වන ක්ෂෙත්‍ර සහකාර | 15 |

## 6.5 සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුරු වලින් නිදහස් වීම

*වගුව 6. 4: සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම*

| | |
|---|---|
| සහකාර වන සංරක්ෂක | 01 |
| සංවර්ධන නිලධාරි | 04 |
| අඩවි වන නිලධාරී | 01 |
| වන ක්ෂේත්‍ර සහකාර | 08 |

## 6.6 මියගිය නිලධාරින් පිළිබඳ විස්තර

*වගුව 6. 5: මියගිය නිලධාරින් පිළිබඳ විස්තර*

| | |
|---|---|
| වන සංරක්ෂක | 01 |
| බීට්ටු වන නිලධාරී | 01 |
| වන ව්‍යාප්ති නිලධාරී | 02 |
| කාර්යාල කාර්ය සහයක | 01 |
| රියදුරු | 01 |
| වන ක්ෂේත්‍ර සහකාර | 01 |

## 6.7 විනය කටයුතු

*වගුව 6. 6: විනය කටයුතු*

| | |
|---|---|
| වැඩ තහනම් කිරීම | 02 |

| | |
|---|---|
| නැවත සේවයේ පිහිටුවීම | 02 |
| වර්ෂය තුළ ආරම්භ කළ විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ | 19 |

## 6.8 සේවය අත්හැර යාම්

*වගුව 6. 7: සේවය අත්හැර යාම්*

| | |
|---|---|
| සංවර්ධන නිලධාරි | 05 |
| වන ක්ෂේත්‍ර සහකාර | 05 |
| වගා කම්කරු | 02 |
| රිය සහායක | 02 |

## 6.9 දේශීය/ විදේශීය පාඨමාලා

*වගුව 6. 8: දේශීය / විදේශීය පාඨමාලා*

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින) | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | | |
| වන ක්ෂේත්‍ර සහකාර ප්‍රේරක පුහුණුව | 36 | 05 | **575** | | දේශීය | වන ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ කාර්යභාරය පිළිබඳ හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා දැනුවත් කිරිම |
| ශාක විශේෂ කළමනාකරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම | 224 | 06 | **278** | | දේශීය | වන වගා ශාක විශේෂ වල කළමනාකරණය පිළිබඳ අවබෝධය ලබාගැනීම |
| රාජ්‍ය භාෂා ප්‍රවීණතාව-දෙමළ භාෂා පුහුණුව | 343 | (පැය 100 *2 හා පැය 150) | **263** | | දේශීය | කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර ගැනීම සඳහා දෙමළ බස |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ප්‍රවීණතාව ලබාගැනීම |
| Payroll පිළිබඳ පුහුණුව | 01 | 03 | **18** | | දේශීය | වැටුප් ගෙවීම් කටයුතු පිළිබඳ අවබෝධය ලබාගැනීම |
| ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම හා පවත්වා ගැනීම පිළිබඳ පුහුණුව | 02 | 01 | **14** | | දේශීය | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම පිළිබඳ දැනුම ලබාගැනීම |
| කොන්ත්‍රාත් පාලනය,ගෙවීම් කිරීමේ ක්‍රියාපටිපාටිය සහ කොන්ත්‍රාත් ලිපිගොනු නඩත්තුව | 02 | 01 | **14** | | දේශීය | වැඩ ප්‍රසම්පාදනය හා පරිපාලනය පිළිබඳ දැනුම |
| පරිපාලන නිලධාරි, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරින් සඳහා පැවති පුහුණුව | 44 | 03 | **108.506** | | දේශීය | ආයතන සංග්‍රහය ,මුදල් රෙගුලාසි පිළිබඳ හා ප්‍රධාන කාර්යාලයට ලිපි ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම |
| රථවාහන හදිසි අනතුරු හා අලාභහානි සම්බන්ධ කටයුතු කිරීම | 27 | 01 | **10.95350** | | දේශීය | රථ වාහන හදිසි අනතුරු හා අලාභ හානි සම්බන්ධව ගොනු කටයුතු කරගෙන යාමට අවශ්‍ය දැනුම ලබාගැනීම. |
| සහකාර වන සංරක්ෂකවරුන් සඳහා වූ පුහුණුව | 17 | 05 | **125** | | දේශීය | සහකාර වන සංරක්ෂකවරුන්ගේ කාර්යභාරය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | පිළිබඳ දැනුවත් කිරිම. |

විදේශීය පුහුණු

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින) | සමස්ථ ආයෝජනය (Rs’000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Gobal 2024 International Conservation Chiefs Academy (ICCA) | 1 | 12 | | | විදේශීය | ජීවී සංරක්ෂණය සඳහා අන්තර් ජාතික නිති ක්‍රියාත්මක කිරිම පිළිබඳ දැනුවත් වීම. |
| APFNet Workshop on Degraded Forest Rehabilitation and Management | 1 | 10 | | | විදේශීය | වනාන්තර යථාවත් කිරීම පිළිබඳ කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම. |
| Capacity Development Programme on Enhancing Non - Wood Forest Products Value Chains Lessons | 2 | 7 | | | විදේශීය | දැව නොවන වනජ ද්‍රව්‍ය භාවිතය හා වැඩිදියුණු කිරිම පිළිබඳ දැනුම ලබාගැනිම. |
| Ministerial Workshop on Comprehensive Sustainable Forest Development Under South - South Cooperation for Developing Countries | 5 | 7 | | | විදේශීය | වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරි පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා චීන - ශ්‍රී ලංකා සහයෝගීතාවය වර්ධනය කරගැනිමට හැකිවීම. |

විදෙස් සම්මන්ත්‍රණ

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින ) | සමස්ථ ආයෝජනය (Rs'000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| 2024 World Forestry Conference | 1 | 4 | | විදේශීය | වන වගා කළමනාකරණ හා පර්යේෂණ පිළිබඳ අදහස් හුවමාරුව |
| Seminar on Green Economy and Environment Protection for Developing Countries | 1 | 14 | | විදේශීය | හරිත ආර්ථිකය හා පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ දැනුම ලබාගැනීම. |
| Seminar on law enforcement and governance under the global development ;initiative for Developing Countries | 5 | 14 | | විදේශීය | සංවර්ධනය වන රටවල් තුල ගෝලීය සංවර්ධනය යටතේ නීති ක්‍රියාත්මක කිරිම් හා පාලනය කිරීම් පිළිබඳ දැනුම ලබාගැනීම |
| Seminar on Natural Heritage Protection and Management for BRI Countries | 2 | 14 | | විදේශීය | විවිධ රටවල ස්වභාවික උරුම ආරක්ෂා කිරීම හා කළමනාකරණය පිළිබඳ දැනුම හුවමාරුව. |
| IUFRO World Forestry Congress | 2 | 7 | | විදේශීය | වන වගා කළමනාකරණ හා පර්යේෂණ පිළිබඳ අදහස් හුවමාරුව |
| Seminar on Biodiversity Sustainable Development for Developing Countries | 1 | 14 | | විදේශීය | ජෛව විවිධත්වය තිරසර වනාන්තර කළමණාකරනය පිළිබඳ දැනුම ලබාගැනීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| Seminar on Ecotourism Development and Management for Sri Lanka | 1 | 14 | | **විදේශීය** | ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබාගැනීම |
| Seminar on United Nations Forest Instrument Implementation and Sustainable Forest Management for Developing Countries | 6 | 14 | | **විදේශීය** | සංවර්ධනය වන රටවල් වල තිරසර වන කළමණාකරනය පිළිබඳ දැනුම ලබාගැනීම. |

## 6.10 පුහුණු වැඩසටහන්

*වගුව 6. 9: පුහුණු වැඩසටහන්*

| වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව (දින) | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| QGIS භාවිතය පිළිබඳ පුහුණුව | 50 | 2024.10.20 සිට 2024.10.24 | 1,089,275.00 | | දේශීය | • QGIS මෘදුකාංගය වනාන්තර කළමණාකරණ ක්ෂේත්‍රයට භාවිතය පිළිබඳව දැනුම ලබා දීම.<br>• QGIS මෘදුකාංගය තුළින් දත්ත විශ්ලේෂණය හා ස්ථානීය දත්ත කළමණාකරණය (Spatial Data Manage-ment) පිළිබඳ දැනුම ලබා දීම.<br>• QGIS මෘදුකාංගය තුළින් වනාන්තර කළමණාකරණය හා සංරක්ෂණය පිළිබඳව ධාරිතාව සංවර්ධනය කිරීම. |
| | 52 | 2024.11.25 සිට 2024.11.28 | 905, 450.00 | | | |
| කළුතර දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු | 65 | 2024.09.09 | 65,000.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරීම පිළිබඳ පුහුණුව | | | | | | පිළිබඳව දැනුම ලබා දීම. |
| ගම්පහ දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 32 | 2024.09.09 | 58,260.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම. |
| කුරුණෑගල දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 95 | 2024.09.10 | 174,000.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| කෑගල්ල දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 57 | 2024.09.10 | 73,995.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| මන්නාරම දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 30 | 2024.09.11 | 69,500.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| පුත්තලම දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 58 | 2024.09.12 | 52,340.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| කිලිනොච්චිය දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු | 45 | 2024.10.14 | 38,700.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරීම පිළිබඳ පුහුණුව | | | | | | |
| මුලතිව් දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 35 | 2024.10.15 | 158,500.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| වවුනියාව දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 25 | 2024.10.16 | 19,75.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| අනුරාධපුර දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 98 | 2024.11.09 | 92,620.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| පොලොන්නරුව දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 45 | 2024.11.19 | 32,850.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| ත්‍රිකුණාමලය දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 45 | 2024.11.20 | 42,750.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |
| මඩකලපුව දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු | 30 | 2024.11.21 | 45,000.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරීම පිළිබඳ පුහුණුව | | | | | | |
| අම්පාර දිසාවේ වන ආවරණ සිතියම - 2023 සකස් කිරීමට අදාලව ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කිරීම පිළිබඳ පුහුණුව | 87 | 2024.11.21 | 66,990.00 | | දේශීය | වන ආවරණ සිතියම සැකසීමට අදාලව ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා පරීක්ෂා කිරීම පිළිබඳව දැනුම ලබා දීම |

## 6.11 ණය ලබාදීම

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට අයත් නිලධාරින්ට රජයේ සේවකයන්ට හිමි ණය යටතේ පහත සඳහන් ණය ලබා දී ඇත.

1. ආපදා ණය 63ක්
2. දේපල ණය ලබා දී නැත.

## 6.12 තොරතුරු අයිතිවාසිකම් ඒකකය

1.මෙම දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන් පහත පරිදි වර්ග කළ හැක.

- පුරවැසියන් - 50
- රාජ්‍ය සංවිධාන - 00
- රාජ්‍ය නොවන සංවිධාන - 09

59

2. ඉල්ලුම් කළ තොරතුරු පහත පරිදි වර්ගීකරණය කළ හැක

- ව.සං.දෙ.ඉඩම් පිළිබඳ ගැටළු - 14
- වන රක්ෂිත පිළිබඳ ගැටළු - 04
- කාර්යය මණ්ඩල ආයතන අංශයේ ගැටළු - 16
- වන ආරක්ෂණය, නීති සම්බන්ධ ගැටලු - 18
- විවිධ තොරතුරු ලබා ගැනීම - 07

59

# 07 පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

*වගුව 7. 1 : අනුකූලතා වාර්තාව*

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූලනො වේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලිකිරීම | අනුකූලනොවීම අනාගතයේදී වළක්වාගැනීමට යෝජනාකරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම්/ ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අනුකූල වේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | භානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11දිනැතිඅංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට,සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ .134 (2)DMA/1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විග ණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ. | ඇතැම් අවස්ථාවන්හිදී මසක කාලයක් තුල පිළිතුරු නොලැබීම | නියමිත කාලය තුලදී පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අංශ දැනුවත් කිරීම. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව ,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 2017/01 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිතවී මාස06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග්පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහන් විධිවිධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අක්‍රීය බැංකු ගිණුම් 31 කින් 15ක් නිරවුල් කර ගැනීම සඳහා මහ භාණ්ඩාගාරය වෙත යවා ඇති අතර ඉතිරි ගිණුම් 16 නිරවුල් කිරීමට අදාල ලියකියවිලි ව්‍යාපෘතීන් අවසන් වූ පසුව ඉදිරිපත් නොකිරීම | ව්‍යාපෘතීන් ආරම්භ කරන අවස්ථාවේදීම ක්‍රමවත් ලියකියවිලි පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දීම |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ණය හිමියන් සහ ඇපකරුවන් සොයා ගැනීම දුෂ්කර විය.සම හර නිලධාරින් මරණයට පත්වීම,වැඩ | ණය හිමියන් හෝ ගනුදෙනුකරුවන් සොයා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තහනමට ලක් වීම,සේවය අත්හිටුවීම ආදී කරුණු හේතුවිය. | |
| **13** | **පොදුතැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ571 . ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වා ර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අනුමත කාර්යය මණ්ඩලය වන.සං.දෙ. වෙත නොලැබීම | පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර අවශ්‍ය අනුමැතිය ඉල්ලුම් කර ඇත. |
| 16.2 | කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | වෙබ් අඩවිය යාවත්කාලීන කර නොමැත | තොරතුරු තාක්ෂණ ඒකකය හරහා අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 2008/05 හා 2018/05(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2018/02 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | - | වාර්ෂික කාර්යසාධන වාර්තා ලබාගන්නා අතර ගිවිසුම් අත්සන් කිරීම සිදු නොකරයි |
| 19.4 | ඉහත චක්‍රලේඛ 6.5ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම | අනුකූල වේ | - | - |